## මහ සභා රැස්වීම - 2025.11.13 දින
## අලව්ව ප්‍රාදේශීය සභාව

2025.11.13 දින පෙ.ව 09.30 ට පමණ අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී පවත්වන්නට යෙදුන අලව්ව ප්‍රාදේශීය සභාවේ VII වන සැසිවාරයේ අට වන මහ සභා රැස්වීම පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවයි.

**මෙදින සහභාගී වූ ගරු මන්ත්‍රීතුමන්ලා / මන්ත්‍රීතුමියන්ලා**

1. ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා
2. ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ. අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. උද්ධාල අරුණසිරි මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එම්. අකිල මධුජිත් කුමාර මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා
12. ගරු ප්‍රාශීය සභා මන්ත්‍රීනි එච්. ලක්ෂ්මී කාන්ති ඥාණලතා මැතිනිය
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. චමින්ද මාල් මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.පී. චන්ද්‍රසිරි මිගාර පතිරණ මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. සිසිර කුමාර රාජපක්ෂ මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී. සිරිල් ජයවර්ධන මැතිතුමා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. සදෙව් ලක්ජය මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.එච්. කපිල පද්මසිරි යාපා මැතිතුමා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා
20. ගරු ප්‍රාශීය සභා මන්ත්‍රී කේ.ඒ. කරුණාරත්න මැතිතුමා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.පී. අජන්තා නීලකුමාරි මැතිනිය
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ආර්. අනිල් කීර්ති බණ්ඩාර මැතිතුමා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එම්.ඒ. චන්දිමා ලක්මාලි මල්ලව ආරච්චි මැතිනිය

**මෙදිනසහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා / මන්ත්‍රීතුමියන්ලා**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සුසිල් ප්‍රේමසිංහ මැතිතුමා

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

අලව්ව ප්‍රාදේශීය සභාවේ VII වන සැසිවාරයේ අට වන මහ සභා රැස්වීම සඳහා පැමිණි ගරු උප සභාපතිතුමිය ප්‍රධාන සියලු ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා මා ඉතාමත් ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා. එමෙන්ම, අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය සහ එම නිළධාරීන් සියලු දෙනාත්, මේ අවස්ථාවට සම්බන්ධවන මාධ්‍යවේදීන් සියලු දෙනාත් ඉතා ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා.

## 01.පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම

### 1.1. 2025.10.09 දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම

**ගරු සභාපති පී.ජී.අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2025.10.09 දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව ඔබතුමන්ලා වෙත ලබාදී තිබෙනවා. එම වාර්තාව සභා සම්මත කිරීමට තීරණයක් ගන්නා මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජ්. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, 2025.10.09 දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්. ලක්ෂ්මි කාන්ති ඥාණලතා මැතිනිය**
ගරු සභාපතිතුමනි, එම සභා වාර්තාව සම්මත කිරීම මා ස්ථිර කරනවා.

ඒ අනුව 2025.10.09 දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

### 1.2. 2025.10.24 දින පැවති විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම

**ගරු සභාපති පී.ජී.අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2025.10.24 දින පැවති විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව ඔබතුමන්ලා වෙත ලබාදී තිබෙනවා. එම වාර්තාව සභා සම්මත කිරීමට තීරණයක් ගන්නා මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා**
ගරු සභාපතිතුමනි, 2025.10.24 දින පැවති විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාශීය සභා මන්ත්‍රීනි එච්. ලක්ෂ්මි කාන්ති ඥාණලතා මැතිනිය**
ගරු සභාපතිතුමනි, එම සභා වාර්තාව සම්මත කිරීම මා ස්ථිර කරනවා.

ඒ අනුව 2025.10.24 දින පැවති විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

## 02.ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන - නැත

## 03. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම

### 3.1. නිවාඩු අනුමත කිරීම

**ගරු සභාපති පී.ජී.අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීවරුනි, නොවැම්බර් මස පැවති මහ සභාවට සහ කාරක සභා රැස්වීම්වලට සහභාගී නොවූ පහත සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහ ගරු මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරීම සඳහා ඉදිරිපත් කරනවා.

**2025.11.13 දින පැවති මහ සභාව සඳහා නිවාඩු අනුමත කිරීම**
1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සුසිල් ප්‍රේමසිංහ මැතිතුමා

**2025.10.21 - නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම සඳහා නිවාඩු අනුමත කිරීම**
1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජ්. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජ්. චමින්ද වර්ණසූරිය මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ජ්. නාරද සිරිවර්ධන මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජ්.සී.පී. අතුකෝරාල මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.චමින්ද මාල් මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී. සිරිල් ජයවර්ධන මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජ්. කරුණාරත්න මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.පී. අජන්තා නීලකුමාරි මැතිනිය
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ආර්. අනිල් කීර්ති බණ්ඩාර මැතිතුමා

**2025.10.21 - පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම සඳහා නිවාඩු අනුමත කිරීම**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.චමින්ද මාල් මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.පී. චන්ද්‍රසිරි මිගාර් පතිරණ මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.එච්. කපිල පද්මසිරි යාපා මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා

**2025.10.22 - කාර්මික සේවා කාරක සභා රැස්වීම සඳහා නිවාඩු අනුමත කිරීම**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.පී. චන්ද්‍රසිරි මිගාර් පතිරණ මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එම්.ඒ. චන්දිමා ලක්මාලි මල්ලව ආරච්චි මැතිනිය

**2025.10.22 - මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම සඳහා නිවාඩු අනුමත කිරීම**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ආර්. අනිල් කීර්ති බණ්ඩාර මැතිතුමා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, නොවැම්බර් මස මහ සභාවට සහ කාරක සභා රැස්වීම්වලට සහභාගී නොවූ ඉහත සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහ ගරු මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, නොවැම්බර් මස පැවති මහ සභාවට සහ කාරක සභා රැස්වීම්වලට සහභාගී නොවූ ඉහත සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහ ගරු මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**<u>04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත</u>**

**<u>05. යථා පරිදි කල්දී ඇති යෝජනා</u>**

**<u>(05.1) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව</u>**
**<u>අංක 07/05/08/01 දරණ යෝජනාව</u>**

අලව්ව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් කොස්කැලේ රක්ෂිතය මායිමේ පවත්වාගෙන යනු ලබන සත්ජය පෙර පාසල සහ දිවා සුරැකුම් මධ්‍යස්ථානය අලව්ව ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.
මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්තුමියත් සමඟ සාකච්ඡා කිරීම පිළිබඳව ගෞරවනීය ස්තුතිය ගරු සභාපතිතුමාට පුද කර සිටිනවා. මම අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ නියැලෙන කාන්තාවක් විදිහට අධ්‍යාපන පද්ධතිය තුළ බොහෝ අධ්‍යාපනික ගැටලු දැක්කා. දේශපාලන වේදිකාවට ඒමට මගේ ඒකායන අරමුණ බවට පත් වුණේත් මෙම වතාවරණයයි.

ඒත් එක්කම අලුත් ආණ්ඩුවක් හදලා ඒ යටතේ කාන්තාවන් සහ අපේ ආදරණීය දරුවන්ට ලස්සන ශ්‍රී ලංකාවක් නිර්මාණය කරලීමට අපි බලාපොරොත්තු වුණා. මට සතුටුයි ගරු සභාපතිතුමනි, අපි පුන පුනා බලා සිටි දෙයක් සහ විශේෂයෙන්ම කාන්තාවන්ට තම දරුවන් සුරක්ෂිතව තබා යන්නට තැනක් නැහැ, ඒ නිසා අලව්ව ප්‍රාදේශීය සභාව තුළින් මේ දේ කරන්න පුළුවන් නම් ඒක ලොකු ජයග්‍රහණයක්. ශ්‍රී ලංකාවේ ජනගහනය තුළ කාන්තාවන් 52%ක් පමණ නියෝජනය කරනවා. ඒ අතරේ කාන්තාවන් බොහෝ පිරිසක් දරුවන්ගේ ප්‍රශ්න ඉදිරියේ බොහෝ ගැටලුවලට මුහුණ දීලා තියනවා. විශේෂයෙන් දරුවන්ගේ ආරක්ෂාව සහ ඔවුන් රැකබලා ගැනීම සම්බන්ධව. දරුවන් රැකබලා ගැනීමට නොහැකිවීම නිසා අපි රාජකාරී කරන අතරේ අපිත් ඒ ගැහැටවලට මුහුණ දුන්නා. මන් හිතන්නේ, අලව්ව ප්‍රදේශයේ රාජකාරී කරන කාන්තාවන් වෙනුවෙන් අපි සියලු දෙනාම එකතු වෙලා දරුවන්ට හොඳ සුරක්ෂිත මෙවන් දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ආරම්භ කරන්නට පුළුවන් නම් හොඳයි. අපි බලාපොරොත්තු වුණ ඒක මල්ඵල ගැන්වෙන මොහොතක්. අපි හැමෝගේම ඒකායන බලාපොරොත්තුව මේ ශ්‍රී ලංකාව තුළ අපේ දරුවන්ට ලස්සන රටක් සහ ජීවත් වෙන්න පුළුවන් රටක් නිර්මාණය කිරීමයි. ඒ නිසා හැමෝම එකතු වෙලා අලව්ව පුරවරයේ කාන්තාවන් වෙනුවෙන් සියලු දෙනාගේම සහයෝගය සමඟ විශේෂයෙන්ම ළදරු පාසල් සහ දිවා සුරැකුම් මධ්‍යස්ථාන ආරම්භ කරමින් අපේ කාන්තාවන්ට සහ දරුවන්ට හොඳ ආරක්ෂිත පරිසරයක් ගොඩ නගන්නට මේ අවස්ථාව අපිට ලබා දීම සම්බන්ධයෙන් නැවතත් ඔබතුමාට ස්තූතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මෙම යෝජනාවට අදාලව නීතිමය පැත්ත බැලුවහම මෙම කොස්කැලේ රක්ෂිත මායිම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පවරාගෙනද තියෙන්නේ? පවරාගෙන තියේ නම් ගැටලුවක් නැහැ.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමා, එම ඉඩම පවරාගෙන තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජී. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මීට අවුරුදු කිහිපයකට කලින් ප්‍රාදේශීය ලේකම් කවුරු හෝ වේවා නිල නිවාසය හදන්න වෙන් කරපු ඉඩම, එනම් සංවර්ධන සභාවේ හිටපු සභාපති ජයවර්ධන මහතා තාවකාලිකව පදිංචි වෙලා හිටපු ඉඩමේ කොටසක් දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ඉදි කිරීම සඳහා වෙන් කරා ඒ කොටස සංවර්ධනය කරලා අවශ්‍ය ගොඩනැගිල්ල හැදුවා. ඒකේ අයිතිය තිබුණේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයටයි. ඒවෙලාවේ වයඹ පළාත් හිටපු ගරු ආණ්ඩුකාර ලක්ෂ්මන් යාපා අබේගුණවර්ධන මැතිතුමාට මේ සම්බන්ධයෙන් ඉල්ලීමක් යොමු කරාම අඩුපාඩුවක් තියනවා නම් කියන්න, කල් අරින් නැතුව මේක විවෘත කරන්න කියලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට කතා කරලා කීවා. ඊට පස්සේ එතුමිය ඒක විවෘත කරා නමුත් ඒකේ ළමුන් වැඩි පිරිසක් හිටියේ නැහැ. විශේෂයෙන්ම ඔබතුමා ප්‍රාදේශීය ලේකම්තුමියත් සමඟ සාකච්ඡා කරමින් ගත් මෙම තීන්දුව ඉතා හොඳ තීරණයක් ඒකට මෙම සභාව තුළ ගෞරවය පුදකර සිටිනවා. මේ සමඟ ඔබතුමා සුසාන භූමි සම්බන්ධවත් ඉල්ලීම කරන්න. ප්‍රාදේශීය සභාව ඉදිරිපස සිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දක්වා බිම් තීරුවක් තියනවා. ඒවා වානිජමය වටිනාකමක් සහිත ඉඩම් ඒවා සභාව යටතට පත් වුණොත් තමයි ඔබතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලය හොයන ආදායම් උත්පාදනය කරන වැඩ පිළිවෙලකට යන්න පුළුවන් වෙන්නේ. ඒවා තියාගෙන රු.20000.00, 30000.00 ක මුදල් මාසිකව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අය කරගන්නේ. නමුත් මෙම පාරේ වීථි පහන් ඇතුළු සියලු සේවාවන් සපයන්නේ සභාවෙන් නමුත් ආදායම යන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයටයි. ඒවගේම පසුගිය දවස්වල සුළඟ හේතුවෙන් කොස්ගහ කඩා වැටීම නිසා ඔබතුමාත් අපහසුතාවයට පත් වුණා කියලා ආරංචි වුණා. ඔබතුමා බලාපොරොත්තු වුණේ සභාවේ නිලධාරීන් යොමු කරලා කොස් ගහ ඉවත් කරන්න. නමුත් සුසාන භූමි ආඥා පනත යටතේ ගහ ගේ උඩ දවස් කිහිපයක් තිබුණා. ගහක් ගේ උඩ තියන්න අවශ්‍යතාවයක් නැහැ. සභාවට පැය 24ක් ඇතුළත ගහක් ඉවත්කරමින් ඒ මනුස්සයාට සහනයක් ලබා දීමේ හැකියාව තියෙන්න ඕනි. ඒක ඉටු කරන්න යනකොට දැව සංස්ථාවෙන් එන්න ඕනිලු. සභාපතිතුමනි, දැව සංස්ථාවෙන් එනකොට මරණයක් වෙලා තිබුණා නම්, ඒ නිසා මේවාගේ දේවල් නොවෙන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සුසාන භූමි සභාවට පවරා ගත යුතුයි. තාමත් ඒකට කඹ අදිනවා. ඉක්මනට ලබා දෙන්න කියලා ඉල්ලීම කරමු. කී මනි ක්‍රමය යටතේ හරි තව කඩ කාමර කිහිපයක් හදලා සභාවට ආදායම් මාර්ගයක් එන විදිහට හදමු. ඔබතුමා මේ පිළිබඳව කාරුණික අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

විශේෂයෙන්ම වාරියපොල දිවා සුරැකුම් මධ්‍යස්ථානය සහ පෙර පාසල අධීක්ෂණය කරපු අවස්ථාවක අපි දැකපු හොඳම පෙර පාසලක්. ළමයි විශාල ප්‍රමාණයක් ඉන්නවා. සභාපතිතුමාගේ ඉල්ලීම මත අවශ්‍ය කරන සියලු පහසුකම් ලැබිලා තියනවා. ගරු උපසභාපතිතුමිය කීවා වගේ අද පෙර පාසලකට දරුවෙක් ඇතුළත් කරන්න ගිහාම ලොකු පාසලකට ඇතුළත් කරන්න යනවාට වඩා වියදමක් යනවා. පුදුම අසරණභාවයකට පත් වෙනවා. කවුරු හරි එක් කෙනෙක් පෙර පාසල් උත්සවයකට අවශ්‍ය මහන ඇඳුම් සඳහා වියදම් කරන් නම් කීවාහම, ඒ ටික ඊළඟ අවුරුද්දේ තව කෙනෙකුට දෙන්න පුළුවන්. ඒ නිසා වාරියපොල ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් එවකට හිටපු ආනන්ද මහතා අපි ගිය වෙලාවක පැහැදිලිව කීවා, කවුරු හරි කෙනෙක් නිල ඇඳුම් ටික දුන්නහම ඒක අවුරුදු පහක් සභාව ඇතුළේ තියාගෙන ඒවා පාවිච්චි කරන්න පුළුවන් මට්ටමක තියන කල් රඳවා ගන්න කියලා. අපි පුළුවන් තරම් දෙමාපියන්ට බරක් නොවෙන්න කටයුතු කරගෙන යන්නයි බලන්නේ කියලා. ඉතින් ගරු සභාපතිතුමනි, අපිට බොහෝ වැඩ තියනවා ඉදිරියට කරගෙන යන්න අපිට පුළුවන් වෙයි කියලා විශ්වාසය පල කරමින් ඔබතුමා ගෙනාපු මෙම හොඳ යෝජනාවට සුභාශිංසන එක් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මෙම යෝජනාව සම්බන්ධයෙන් මමත් අදහසක් පල කරන්න හිතුවා. 1969 ගණන්වල වගේ, අපේ කුඩා කාලයේ පෙර පාසල් තිබුන් නැහැ. අද ඉන්න දරුවෝ ගොඩාක් වාසනාවන්තයි. අපිට පහසුකම් අඩුවෙන් තිබුණත්, අපි කුඩා කාලයේ ස්භාව සෞන්දර්යය විඳිමින් විනෝදයෙන් තමා පාසල් ගියේ. එහෙම සුන්දර අතීතයක් අපිට තිබුණා. අද දරුවන්ට සියලු පහසුකම් තියනවා. අපේ දරුවන්ගේ දරුවෝ හරි වාසනාවන්තයි. කාලයෙන් කාලයට වෙනස් වෙනවානේ, ඒ නිසා සියලු සැප පහසුකම් අපි දෙන්න ඕනි. අපිට ඒවා හිමි නොවුණා කියලා අපි ඒවාට විරුද්ධ වෙන්න ඕනි නැහැ. විදේශ රටවල, පින්ලන්තය වගේ රටවල් ගත්තහම සියලු පහසුකම් සහිත දියුණු අධ්‍යාපනයක් තියෙන්නේ. ඒ දියුණුව ලංකාවටත් ලැබෙන්න ඕනි. ඔබතුමාලා ක්ලීන් ශ්‍රී ලංකා ව්‍යාපෘතියක් දියත් කරලා තියනවා, ඒ තුළින් ලංකාව සුරපුරයක් කරන්න හදනවා. අපි ඒවාට අශිර්වාද කරනවා. අපි ඒවා කරන්නේ අපි වෙනුවෙන් නෙවේ අපේ දරුවෝ වෙනුවෙනුයි. මහජන නියෝජිතයෝ හැටියට අපේ සියලුම සහයෝගය ඒවාට ලබා දෙනවා. ඒ නිසා මෙම යෝජනාව සම්බන්ධයෙන් සතුට සහ කැමැත්ත ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී. සිරිල් ජයවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ''පෙහොසත් රටක් ලස්සන ජීවිතයක්'' යන තේමාව යටතේ ආණ්ඩුව හොඳ ගමනක් යමින් තියනවා. දරුවන් ප්‍රධාන ඉලක්කය කර ගනිමින් ඉදිරිපත් කළ යෝජනාව අගය කරනවා. පෙර පාසල් වයස සහ ඊට පහළ දරුවන්ට හොඳ රැකවරණයක් ලබා දීමට නොහැකි වීම සම්බන්ධයෙන් දෙමාපියන් ලොකු ගැටලුවක ඉන්නවා. අපේ ආසන්නයේම ගත්තහම දරුවෝ ටික ගෙවල්වල දාලා යනවා ඒ ළමයි හරිම අසරණ වෙලා තියනවා. හරියට කෑමක් බීමක් රැකවරණයක් නැහැ. විධිමත් ආකාරයට දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් හදලා ඒ ඒ වයස් කාණ්ඩයට අදාල ක්‍රියාකරකම් සමඟ යාන්ත්‍රණයක් හැදීම තුළ අපේ බලාපොරොත්තු ඉෂ්ට වෙනවා. මූලික අරමුණ අපේ දරුවා නිසා කුඩා කල සිටම ඒ වයසට අදාල ක්‍රියාකරකම් සමඟ දරුවා හරි විදිහට හැදිය යුතුයි. ඒක පෙර පාසල් සහ දිවා සුරැකුම් තුළින් නිර්මාණය කළ හැකියි. ඒ නිසා ඒවා විද්‍යාත්මක ක්‍රමවේදයක් ඇතුළේ සකස් විය යුතුයි. සමහර දිවා සුරැකුම් මධ්‍යස්ථානවල දරුවන්ට හරියට පෝෂණයක්වත් ලැබෙන් නැහැ. උපක්‍රමශීලිව කෑම ටිකවත් කවා ගන් නැහැ. ඒවා ගැනත් සැලකිලිමත් වෙලා ඒ පිළිබඳව සොයා බලන්න කියලා ඉල්ලා සිටිනවා. ඒවගේම ආණ්ඩුව මේ වෙනකොට ලොකු මෙහෙයුමක් දියත් කරගෙන යනවා. දරුවෝ ටික බේරා ගැනීම සඳහා රට පුරා ව්‍යාප්ත වෙලා තියන කුඩු ජාවාරම් ටික ඉහළින්ම කඩා ගෙන යනවා. මම උසාවියේ නීතිඥවරයෙක්ගෙන් ඇහුවා මේ දවස්වල මත්ද්‍රව්‍ය ප්‍රශ්නය කොහොමද කියලා. වෙනදට මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් ප්‍රශ්න 15, 16ක් එනවා, දැන් 5ක් 6ක් එන්නේ කීවා. අපිට පැහැදිලිව පේනවා මේ තොරතුරු සමඟ රට හරි තැනකට යනවා කියලා. ඒ නිසා දරුවන් වෙනුවෙන් ගත් මෙම තීරණය සම්බන්ධයෙන් ස්තූතිවන්ත වෙනවා.

ඒ අනුව, අලව්ව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් කොස්කැලේ රක්ෂිතය මායිමේ පවත්වාගෙන යනු ලබන සත්ජය පෙර පාසල සහ දිවා සුරැකුම් මධ්‍යස්ථානය අලව්ව ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05.2) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව අංක 07/05/08/02 දරණ යෝජනාව**

2025/12/31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා පහත සඳහන් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත්කර ගැනීමට හා මෙම සමීක්ෂණ නිලධාරීන් සේවා ස්ථානයට ආසන්නව සමීක්ෂණ කටයුතුවල නිරතවන අවස්ථාවලදී, එම නිලධාරීන් සඳහා පැය 8ක සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව සංයුක්ත දීමනාවට සමාන දීමනාවක් ප්‍රධාන ලේකම්ගේ අංක 01/2015 චක්‍රලේඛයට අනුව ගෙවීම් කිරීමට අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

| අනු අංකය | භාණ්ඩ සමීක්ෂණය පවත්වන ස්ථානය | භාණ්ඩ සමීක්ෂණය සඳහා සහභාගී වන ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු සහ නිලධාරීන් |
|---|---|---|
| 01 | ප්‍රධාන කාර්යාලය /ප්‍රජා ශාලාව | 01)සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ :- ගරු උප සභාපතිනී එම්. සී . එම් නන්දසේන මැතිනිය<br>02)සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ :- ගරු ප්‍රා.ස. මන්ත්‍රී වයි.එච්.කපිල පද්මසිරි යාපා මැතිතුමා<br>03) සමීක්ෂණ මණ්ඩල සභාපති :- නාරම්මල ප්‍රාදේශීය සභාවේ නිලධාරී<br>04)සමීක්ෂණ මණ්ඩල සාමාජික :- නාරම්මල ප්‍රාදේශීය සභාවේ නිලධාරී<br>05)සමීක්ෂණ මණ්ඩල සාමාජික :- ප්‍රියන්ති නිරෝෂනී මිය |
| 02 | ආයුර්වේදය/ පොදු වෙළඳ සංකීර්ණය /සතිපොල/සණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානය/ අලව්ව මහජන ක්‍රීඩාංගනය | 01)සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා.ස. මන්ත්‍රී :-.එල්.එච්.සදෙව් ලක්ජය මැතිතුමා<br>02)සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා.ස. මන්ත්‍රී :-.කේ.චමින්ද මාල් මැතිතුමා<br>03)සමීක්ෂණ මණ්ඩල සභාපති :- කේ.ඒ. සමන්ලතා මිය (ප්‍රජා සං.නි.)<br>04)සමීක්ෂණ මණ්ඩල සාමාජික :- ජේ.එම්.ඩී.ඩී. ජයකඩු මිය (සං.නිල)<br>05)සමීක්ෂණ මණ්ඩල සාමාජික :- එම්.එස්.සුදුසිංහ මිය (සං.නිල.)<br>06)සමීක්ෂණ මණ්ඩල සාමාජික :- ඊ.ඒ.එස්.එන් .කරුණානායක මිය (කළ.සේවා. නි.)<br>07)සමීක්ෂණ මණ්ඩල සාමාජික :- ඉසංකා ජයසූරිය මිය (සං.නිල.) |
| 03 | මහරච්චිමුල්ල උප කාර්යාලය | 01) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා.ස. මන්ත්‍රී :-.එච්. එම් සුසිල් ප්‍රේමසිංහ මැතිතුමා.<br>02) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා.ස. මන්ත්‍රී :-.කේ. එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා<br>03) සමීක්ෂණ මණ්ඩල සභාපති :-ඊ.එම්.පී. ආර්. කේ.ඒකනායක මිය (සං.නිල)<br>04) සමීක්ෂණ මණ්ඩල සාමාජික :- එච්.ආර්.එස්. ගුණසේකර මිය (සං.නිල)<br>05) සමීක්ෂණ මණ්ඩල සාමාජික :- එච්.එම්.එච්. හේරත් මිය (සං.නි) |
| 04 | කැප්පිටිවලාන උප කාර්යාලය / බෝයවලාන ප්‍රජා ශාලාව බෝයවලාන සතිපොල හා බෝයවලාන වෙළඳ සංකීර්ණය | 01)සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා.ස. මන්ත්‍රී :- කේ.ඒ. උද්ධාල අරුණසිරි මැතිතුමා<br>02)සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා.ස. මන්ත්‍රී :-.එල්. පී. චන්ද්‍රසිරි මිගාර පතිරණ මැතිතුමා<br>03))සමීක්ෂණ මණ්ඩල සභාපත :- කේ.පී.එස්.එම් ගුණසේන මිය (කළ.සේ.නි)<br>04) සමීක්ෂණ මණ්ඩල සාමාජික :-ජන්මි රත්නායක මිය(සං.නිල)<br>05)සමීක්ෂණ මණ්ඩල සාමාජික :- ගයානි තිලකරත්න මිය (සං.නිල) |
| 05 | අලව්ව මහජන පුස්තකාලය | 01) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු උප සභාපතිනී :- එම්. සී . එම් . නන්දසේන මැතිනිය<br>02) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා.ස. මන්ත්‍රීනී :- එච්. ලක්ෂ්මී කාන්ති ඥානලතා මැතිනිය<br>03) සමීක්ෂණ මණ්ඩල සභාපති :- එන්.එම්. එස්. රණසිංහ මිය (කළ. සේවා නිලධාරී)<br>04) සමීක්ෂණ මණ්ඩල සාමාජික :- එච්.ඩී.පී.හේවාරත්න මිය (සං.නිල)<br>05) සමීක්ෂණ මණ්ඩල සාමාජික :- එම්. එස් මාරසිංහ මිය(සං.නි.)<br>06) සමීක්ෂණ මණ්ඩල සාමාජික :- ඩබ්.එම්.මංජුලා ඥානරත්න මිය(සං.නිල)<br>07) සමීක්ෂණ මණ්ඩල සාමාජික :- එච්.ඒ.පී.සී හේරත් මිය (සං.නිල) |

| | | |
|---|---|---|
| 06 | මහරච්චිමුල්ල මහජන පුස්තකාලය | 01) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා.ස. මන්ත්‍රී :- එච්. එම් සුසිල් ප්‍රේමසිංහ මැතිතුමා.<br>02) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා.ස.මන්ත්‍රී:-.එල්.එම් අකිල මධුජිත් කුමාර මැතිතුමා<br>03) සමීක්ෂණ මණ්ඩල සභාපති :- ආර්. එම්. ඒ. රණසිංහ මිය ( සං.නිල.)<br>04) සමීක්ෂණ මණ්ඩල සාමාජික :- ආර්.එස්. වික්‍රමසිංහ මිය (සං.නිල)<br>05) සමීක්ෂණ මණ්ඩල සාමාජික :- ඩී.එම්.එන්.ඩී.දිසානායක මිය(සං..නිල)<br>06) සමීක්ෂණ මණ්ඩල සාමාජික :- කේ.පී.එන්. එස්.විජේරත්න මිය( සං. නි) |
| 07 | බෝයවලාන මහජන පුස්තකාලය | 01) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා.ස.මන්ත්‍රී :- ඩබ්. පී. සිරිල් ජයවර්ධන මැතිතුමා<br>02) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා.ස. මන්ත්‍රී :-. එල්. පී. චන්ද්‍රසිරි මිගාර පතිරණ මැතිතුමා<br>03) සමීක්ෂණ මණ්ඩල සභාපති :- ඒ. ජී.එන්.එන්.අක්මීමන මිය (කළ. සේවා නිලධාරී)<br>04) සමීක්ෂණ මණ්ඩල සාමාජික :- පී.එම්.පී.එන්.පතිරාජ මිය (සං.නිල)<br>05) සමීක්ෂණ මණ්ඩල සාමාජික :- ඩබ්.එස්.පී.පී. වර්ණසූරිය මිය (සං.නිල)<br>06)සමීක්ෂණ මණ්ඩල සාමාජික :- එම්. අයි දසනායක මෙය (සං.නි.) |
| 08 | මල්ගොමුව පෙර පාසල | 01) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා.ස. මන්ත්‍රී :-.ආර්.එම්. සිසිර කුමාර රාජපක්ෂ මැතිතුමා<br>02) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා.ස.මන්ත්‍රී :- කේ.චමින්ද මාල් මැතිතුමා<br>03) සමීක්ෂණ මණ්ඩල සභාපති :- ඩී. එම්. ටී.බී. දිසානායක මයා (සං. නිල)<br>04) සමීක්ෂණ මණ්ඩල සාමාජික :- එච්.ඩී.එස් .හේරත් මිය (සං.නිල.)<br>05) සමීක්ෂණ මණ්ඩල සාමාජික :-නයෝමි ධර්මසේන මිය (සං.නිල) |
| 09 | සුධම්ම පෙර පාසල | 01) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා.ස. මන්ත්‍රී :-. එල්.එච්.සදෙව් ලක්ජය මැතිතුමා<br>02) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා.ස. මන්ත්‍රී :- වයි.එච්.කපිල පද්මසිරි යාපා මැතිතුමා<br>03) සමීක්ෂණ මණ්ඩල සභාපති :- රුක්මා රාජපක්ෂ මිය(සං. නි)<br>04) සමීක්ෂණ මණ්ඩල සාමාජික :- රුවන් අධිකාරි මයා( කළසේ. නිලධාරී)<br>05) සමීක්ෂණ මණ්ඩල සාමාජික :- එරංගා ගුණතිලක මිය (සං නිල) |
| 11 | මද්දුම බණ්ඩාර පෙර පාසල | 01) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා.ස.මන්ත්‍රී :-කේ. ඒ. උද්ධාල අරුණසිරි මැතිතුමා<br>02) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා.ස.මන්ත්‍රී :-කේ.එච්.පී. යූ.කේ. කරුණාරත්න මැතිතුමා<br>03) සමීක්ෂණ මණ්ඩල සභාපති :- අයේෂා ගුණසේකර මිය (කළ.සේ.නිල)<br>04) සමීක්ෂණ මණ්ඩල සාමාජික :- රුචිනි ආරියසිංහ මිය(සං. නි)<br>05) සමීක්ෂණ මණ්ඩල සාමාජික :- මල්ෂා ධර්මසේන මිය (සං. නි) |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඇත්තටම කණගාටුදායක තත්වයක්.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ අදහස් සමඟම අදාල ආයතනවලට අනිත් මන්ත්‍රීවරුනුත් ඇතුළත් කරමින් යෝජනා කරන්න කියලා ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා. මම ඒ අඩුපාඩුව දැක්කා එතකොට ඒක ඔබතුමන්ලා වෙත යොමු කරලා අවසන්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එහෙම නොවුණොත් මේක ඒකපාර්ශික වෙනවානේ ඒක ඇත්තටම හොඳ නැහැ.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමා, එම ආයතනවලට ආසන්න මන්ත්‍රීවරුන් සම්බන්ධ කරගන්න කියලා යෝජනාව ඉදිරිපත් කරමු. සද්භාවයෙන් මම කියන්නේ මේක හිතාමතා කරපු දෙයක් නෙවේ. මේ සම්බන්ධයෙන් අදාල විෂය නිලධාරි දැනුවත් කරනකොට, සභාවේදී මම නිවැරදි කරන්නම් කියලා කීවා.මෙම යෝජනාවේ ප්‍රශ්නයක් තියනවා කියලත් දොලොස්දෙනා දන්නේවත් නැහැ. මෙයාලා කවුරුවත් දන් නැහැ මම විතරයි දන්නේ. ඔබතුමා යෝජනාවක් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ඉහත ඉදිරිපත් කළ ඇති සමීක්ෂණ මණ්ඩලයේ සඳහන් සංයුතියට අමතරව මෙම සමීක්ෂණයන් සිදු කරන ආයතන ආසන්නයේ සිටින විපක්ෂයේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලාගේ නම් ඇතුළත් කරමින් පහත සඳහන් පරිදි සංයුතිය සංශෝධනය කරන ලෙස මා යෝජනා කරනවා.

| අනු අංකය | භාණ්ඩ සමීක්ෂණය පවත්වන ස්ථානය | භාණ්ඩ සමීක්ෂණය සඳහා සහභාගි වන ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිවරු සහ නිළධාරීන් |
|---|---|---|
| 01 | ප්‍රධාන කාර්යාලය/ ප්‍රජා ශාලාව | 01) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු උප සභාපතිනි:- එම්.සී.එම්.නන්දසේන මැතිණිය<br>02) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා ස. මන්ත්‍රි :- වයි.එච්.කපිල පද්මසිරි යාපා මැතිතුමා<br>03) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා ස. මන්ත්‍රි :-ඩබ්.ඒ.මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා<br>04) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා ස.මන්ත්‍රී :-ඩබ්.ඒ.චමින්ද වර්ණසූරිය මැතිතුමා<br>05) සමීක්ෂණ මණ්ඩල සභාපති :- නාරම්මල ප්‍රාදේශීය සභාවේ නිළධාරි<br>06) සමීක්ෂණ මණ්ඩල සාමාජික:- නාරම්මල ප්‍රාදේශීය සභාවේ නිළධාරි<br>07) සමීක්ෂණ මණ්ඩල සාමාජික:- ප්‍රියන්ති නිරෝෂණී මිය (කළ.සේ.නිළ) |
| 02 | නිදහස් ආයුර්වේද මධ්‍යස්ථානය/ සන අපද්‍රව්‍ය මධ්‍යස්ථානය/ | 01) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා ස. මන්ත්‍රී:- එල්.එච්.සදෙව් ලක්ජය මැතිතුමා<br>02) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා ස. මන්ත්‍රී:- කේ.චමින්ද මාල් මැතිතුමා<br>03) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා ස. මන්ත්‍රී:-ඒ.සී.පී.අතුකොරල මැතිතුමා<br>04) සමීක්ෂණ මණ්ඩල සභාපති :- ජේ.එම්.අයි.ඩී.ජයසූරිය මිය (සං.නිළ)<br>05) සමීක්ෂණ මණ්ඩල සාමාජික:- එස්.එම්.සුදුසිංහ මිය (සං.නිළ)<br>06) සමීක්ෂණ මණ්ඩල සාමාජික:-ඊ.ඒ.එස්.එන් කරුණානායක මිය (කළ.සේ.නිළ.) |
| 03 | අලව්ව සතිපොල/ පොදු වෙළඳ සංකීර්ණය/ අලව්ව මහජන ක්‍රීඩාංගනය | 01) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා.ස. මන්ත්‍රී:- එල්.එච්.සදෙව් ලක්ජය මැතිතුමා<br>02) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා.ස. මන්ත්‍රී:- වයි.එච්.කපිල පද්මසිරි මැතිතුමා<br>03) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා.ස. මන්ත්‍රී:-එස්.එම්.එස්.ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා<br>04) සමීක්ෂණ මණ්ඩල සභාපති:-ජේ.එම්.ඩී.ඩී.ජයකඩු මිය (සං.නිළ)<br>05) සමීක්ෂණ මණ්ඩල සාමාජික:-කේ.පී.ඩී.ආර්.පතිරණ මිය (සං.නිළ)<br>06) සමීක්ෂණ මණ්ඩල සාමාජික:-එස්.එම්.ඊ.එල් ගුණතිලක මිය (සං.නිළ) |
| 04 | මහරච්චිමුල්ල උප කාර්යාලය | 01) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා. ස. මන්ත්‍රී :- එස්.එම්.සුසිල් ප්‍රේමසිංහ මැතිතුමා<br>02) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා. ස.මන්ත්‍රී :-කේ.එච්.ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා<br>03) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා. ස. මන්ත්‍රී :-ජේ.එම්.අරුණ ජයලත් මැතිතුමා<br>04) සමීක්ෂණ මණ්ඩල සභාපති:- ඒ.ජී.එන්.එන්.අක්මීමන මිය (කළ.සේ..නිළ)<br>05) සමීක්ෂණ මණ්ඩල සාමාජික:- එච්.ආර්.එස්.ගුණසේකර මිය (සං.නිළ)<br>06) සමීක්ෂණ මණ්ඩල සාමාජික:- එච්.එම්.එච්.හේරත් මිය (සං.නිළ) |

| | | |
|---|---|---|
| 05 | කැප්පිටිවලාන උප කාර්යාලය/ බෝයවලාන ප්‍රජා ශාලාව/ බෝයවලාන සති පොල හා බෝයවලාන වෙළඳ සංකීර්ණය | 01) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා. ස. මන්ත්‍රී:- කේ.ඒ.උද්ධාල අරුණසිරි මැතිතුමා<br>02)සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණගරු ප්‍රා. ස. මන්ත්‍රී :- එල්.පී.චන්ද්‍රසිරි මිගාර පතිරණ මැතිතුමා<br>03) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණගරු ප්‍රා. ස. මන්ත්‍රී :- එස්.ඒ.නාරද සිරිවර්ධන මැතිතුමා<br>04) සමීක්ෂණ මණ්ඩල සභාපති :-කේ.පී.එස්.එම්.ගුණරත්න මිය (කළ.සේ.නිළ.)<br>05) සමීක්ෂණ මණ්ඩල සාමාජික:- ජන්මි රත්නායක මිය(සං.නිළ)<br>06) සමීක්ෂණ මණ්ඩල සාමාජික:- ගයානි තිලකරත්න මිය (සං.නිළ) |
| 06 | අලව්ව මහජන පුස්තකාලය | 01) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු උප සභාපතිනි:- එම්.සී.එම්.නන්දසේන මැතිණිය<br>02) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා ස.මන්ත්‍රීනී :- එච්.ලක්ෂ්මී කාන්ති ඥානලතා මැතිණිය<br>03) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා. ස.මන්ත්‍රී :-ඩබ්.ඒ.චමින්ද වර්ණසූරිය මැතිතුමා<br>04) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා.ස.මන්ත්‍රීනී :-ආර්.ඒ.ඒ.ඩී.රණවීර මැතිණිය<br>05) සමීක්ෂණ මණ්ඩල සභාපති :-අයේෂා ගුණසේන මිය(ප්‍ර.කළ.සේ.නිළ.)<br>06) සමීක්ෂණ මණ්ඩල සාමාජික:- එම්.එස්.මාරසිංහ මිය(සං.නිළ)<br>07) සමීක්ෂණ මණ්ඩල සාමාජික:-එච්.ඒ.පී.සී.හේරත් මිය(සං.නිළ) |
| 07 | මහරච්චිමුල්ල මහජන පුස්තකාලය | 01) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා. ස. මන්ත්‍රී :- එස්.එම්.සුසිල් ප්‍රේමසිංහ මැතිතුමා<br>02) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා. ස. මන්ත්‍රී :- එල්.එම්.අකිල මධුජිත් කුමාර මැතිතුමා<br>03) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණගරු ප්‍රා. ස. මන්ත්‍රී :- කේ.ඒ.කරුණාරත්න මැතිතුමා<br>04) සමීක්ෂණ මණ්ඩල සභාපති :- ආර්.එම්.ඒ.රණසිංහ මිය (සං.නිළ)<br>05) සමීක්ෂණ මණ්ඩල සාමාජික:- ඊ.එස්.වික්‍රමසිංහ මිය (සං.නිළ)<br>06) සමීක්ෂණ මණ්ඩල සාමාජික:-කේ.පී.එන්.එස්.විජේරත්න මිය (සං.නිළ) |
| 08 | බෝයවලාන මහජන පුස්තකාලය | 01) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා. ස. මන්ත්‍රී :- ඩබ්.පී.සිරිල් ජයවර්ධන මැතිතුමා<br>02) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා. ස. මන්ත්‍රී :- එල්.පී.චන්ද්‍රසිරි මිගාර පතිරණ මැතිතුමා<br>03) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා. ස. මන්ත්‍රීනී :-ආර්.පී.අජන්තා නීලකුමාරි මැතිණිය<br>04) සමීක්ෂණ මණ්ඩල සභාපති :- කේ.ඒ.අයි.සමන්ලතා කළුආරච්චි මිය (ප්‍ර.ස.නිළ)<br>05) සමීක්ෂණ මණ්ඩල සාමාජික:- ඩබ්.එම්.මංජුලා ඥානරත්න මිය (සං.නිළ)<br>06) සමීක්ෂණ මණ්ඩල සාමාජික:- එම්.අයි.දසනායක මෙය (සං.නිළ) |
| 09 | මල් ගොමුව පෙර පාසල | 01) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා. ස. මන්ත්‍රී :- ආර්.එම්.සිසිර කුමාර රාජපක්ෂ මැතිතුමා<br>02) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා. ස. මන්ත්‍රී :- කේ.චමින්ද මාල් මැතිතුමා<br>03) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා. ස. මන්ත්‍රී :-ඩබ්.ආර්.අනිල් කිර්ති බණ්ඩාර මැතිතුමා<br>04) සමීක්ෂණ මණ්ඩල සභාපති :-ඩී.එම්.ටී.දිසානායක මයා (පූ. ළමා. සං.නිළ)<br>05) සමීක්ෂණ මණ්ඩල සාමාජික:- එච්.ඩී.එස්.හේරත් මිය (සං.නිළ)<br>06) සමීක්ෂණ මණ්ඩල සාමාජික:- නයෝමි ධර්මසේන මිය (සං.නිළ) |

| | | |
|---|---|---|
| 10 | සුධම්ම පෙර පාසල-මාබෝපිටිය | 01) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා. ස. මන්ත්‍රී :- ආර්.එම්.සිසිර කුමාර රාජපක්ෂ මැතිතුමා<br>02) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා. ස. මන්ත්‍රී :-කේ.චමින්ද මාල් මැතිතුමා<br>03) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා. ස. මන්ත්‍රී :-ජී.සමන්ත යත්තල්ගොඩ මැතිතුමා<br>04) සමීක්ෂණ මණ්ඩල සභාපති :-ඩී.එම්.ටී.දිසානායක මයා (පූර්ව ළමා. සං.නිළ)<br>05) සමීක්ෂණ මණ්ඩල සාමාජික:- එම්.ඩී.එන්.ප්‍රසංගිකා මිය(සං.නිළ)<br>06) සමීක්ෂණ මණ්ඩල සාමාජික:- එම්.ඩබ්.අයි.පේමරත්න මිය (සං.නිළ) |
| 11 | මද්දුම බණ්ඩාර පෙර පාසල | 01) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා. ස. මන්ත්‍රී:- කේ.ජ්.උද්ධාල අරුණසිරි මැතිතුමා<br>02) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා. ස. මන්ත්‍රී :- කේ.එච්.ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා<br>03) සමීක්ෂණ මණ්ඩල අධීක්ෂණ ගරු ප්‍රා. ස. මන්ත්‍රිනී :- එම්.ජ්.චන්දිමා ලක්මාලි මල්ලව ආරච්චි මැතිනිය<br>04) සමීක්ෂණ මණ්ඩල සභාපති :- රුවන් අධිකාරි මයා (කළ.සේවා නිළ.)<br>05) සමීක්ෂණ මණ්ඩල සාමාජික:- ජී.ආර්.එස්.ආරියසිංහ මිය (සං.නිළ)<br>06) සමීක්ෂණ මණ්ඩල සාමාජික:- කේ.පී.එම්.එච්.ධර්මසේන මිය (සං.නිළ) |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. චමින්ද මාල් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ඉහත සංශෝධන වලට යටත්ව එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2025/12/31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ඉහත සඳහන් සංශෝධන වලට යටත්ව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත්කර ගැනීමට හා මෙම සමීක්ෂණ නිලධාරීන් සේවා ස්ථානයට ආසන්නව සමීක්ෂණ කටයුතුවල නිරතවන අවස්ථාවලදී, එම නිලධාරීන් සඳහා පැය 8ක සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව සංයුක්ත දීමනාවට සමාන දීමනාවක් ප්‍රධාන ලේකම්ගේ අංක 01/2015 චක්‍රලේඛයට අනුව ගෙවීම් කිරීමට අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05.3) <u>ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව අංක 07/05/08/03 දරණ යෝජනාව</u>**

අලව්ව ප්‍රාදේශීය සභාව විසින් රු මිලියන 20 ක මුදලින් 2022/04/26 ආරම්භ කරන ලද ගිණුම් අංක 149-60-01-0001636-9 දරණ ස්ථාවර තැන්පතුව 2025/10/26 දින වන විට රු.29,951,668.99 ක් දක්වා වර්ධනය වී ඇති අතර, ඒ සඳහා මේ වන විට ලැබෙනුයේ 6.5%ක පොළී අනුපාතයක් වන බැවින් අදාල ගිණුම වසා නව පොළී අනුපාත රාජ්‍ය බැංකු මඟින් කැඳවා ඉහත මුදල **රු.මිලියන 30**ක් දක්වා වැඩි කර **රු. මිලියන 20** හා **රු.මිලියන 10** ලෙස මාස හයෙන් කල් පිරෙන අයුරින් ස්ථාවර තැන්පතු දෙකක ආයෝජනයක් හා හදිසි අවස්ථාවක භාවිතා කිරීමේ අරමුණින් වැඩි පොළී අනුපාතයක් ලබා දෙන බැංකුවේ ආරම්භ කිරීමටත්, බැංකු මඟින් අදාල පොළී අනුපාත ලබා දෙනුයේ කෙටි දින ගණනකට වලංගු වන සේ බැවින් නැවතත් මහා සභා අනුමැතියකින් තොරව ප්‍රසම්පාදන තීරණය අනුව ඉහත ස්ථාවර තැන්පතු ආරම්භ කිරීමට සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජ්. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමාගේ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් නැහැ සභාව සතු දේපල රැක ගැනීම සහ ඒ සම්බන්ධව කටයුතු කිරීමේ වගකීම මහජන මන්ත්‍රී මණ්ඩලයක් හැටියට අපිට තියනවා. බැංකු පොළී සම්බන්ධව මෙම යෝජනාවේ සටහන් කරලා තියනවා ඒක ඇත්ත. බැංකුව මාස හයෙන් හයට හෝ දින 100 කල් පිරීමේ ලිපි එවලා ඒක යථාවත් කරගනිමින් ඒ කටයුතු ඉදිරියට සිදු කරගෙන යනවා. සාමාන්‍යයෙන් ලක්ෂ 100කට මාසයකට රු.60000.00 ක් වගේ හම්බෙන්නේ.

මම මේ කියන්නේ බැංකුවලට ගිහින් කතා කරාම කියන දේවල් අපේ මුදල ගලවනවා කීවොත් විතරක් පොලිය වැඩි වෙනවා. ඒකේ උපරිමයට යන එක සහ මේක හොඳ වැඩපිළිවෙලක් ලෙස නිලධාරී මණ්ඩලයට මතක් කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**

ගරු සභාපතිතුමනි, දැනට අපිට ලැබෙන්නේ 6.5% ක පොලී අනුපාතයක්. සාකච්ඡාව යන අතරතුර මම මහජන බැංකුවේ කළමනාකරණ තුමියට කතා කරා. එතුමිය ප්‍රකාශ කරා අවුරුදු දෙකකට 9.15% ක පොලී අනුපාතයක් අපිට දෙන්නම් කියලා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමා, මේ වෙලාවේ අපිට ප්‍රශ්නයක් තියනවා. ආදාහනාගාරය සහ සභා ගොඩනැගිල්ල යන ව්‍යාපෘති දෙකේම ඉදිරි කටයුතු සිදු කරමින් පවතින නිසා අවුරුදු දෙකකට ස්ථාවර තැන්පතුව දාන්න විදිහක් නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**

ගරු සභාපතිතුමා, මෙහෙම ප්‍රශ්නයක් තියනවා. අපි 9.5% ට දාපුවාහම අපිට අවශ්‍ය නම් 90% ක ලෝන් එකක් ආපහු ගන්න පුළුවන්. ලෝන් එකේ 9.15% ක පොලියක් දෙනවා නම්, 11.15% ක් තමා ගන්න මුදලට පොලිය හැදෙන්නේ. දශම දෙකයි වැඩි වෙන්නේ. එතකොට අපේ මුදලත් තියනවා. පොලී අනුපාතය 9% ගාණකින් එලෙසම රඳවා ගන්න පුළුවන්. දැන් සිස්ටම් එක තියෙන්නේ සල්ලිවලින් සල්ලි හොයන ක්‍රමයක්. මන් හිතන්නේ, සභාව විදිහට අපි ලක්ෂ 30ක් ගත්තොත් ලක්ෂ 25කට වඩා අපිට ආපහු ගන්න පුළුවන්. ඒ නිසා මේ පොලී අනුපාතයත් එක්ක බලලා සුදුසු පියවරක් ගන්න කියලා ලේකම්තුමියගෙන් සහ ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමා, ඒක තාක්ෂණික කාරණාවක් නිසා ඒ අයට තීරණය කරලා පසුව අපිට දන්වන්න දෙමු.

ඒ අනුව, අලව්ව ප්‍රාදේශීය සභාව විසින් රු මිලියන 20 ක මුදලින් 2022/04/26 ආරම්භ කරන ලද ගිණුම් අංක 149-60-01-0001636-9 දරණ ස්ථාවර තැන්පතුව 2025/10/26 දින වන විට රු.29,951,668.99 ක් දක්වා වර්ධනය වී ඇති අතර, ඒ සඳහා මේ වන විට ලැබෙනුයේ 6.5%ක පොළී අනුපාතයක් වන බැවින් අදාල ගිණුම වසා නව පොළී අනුපාත රාජ්‍ය බැංකු මඟින් කැඳවා, **රු.මිලියන 30ක්** කර **රු. මිලියන 20** හා **රු.මිලියන 10** ලෙස මාස හයෙන් කල් පිරෙන අයුරින් ස්ථාවර තැන්පතු දෙකක ආයෝජනයක් හා හදිසි අවස්ථාවක භාවිතා කිරීමේ අරමුණින් වැඩි පොළී අනුපාතයක් ලබා දෙන බැංකුවේ ආරම්භ කිරීමටත්, බැංකු මඟින් අදාල පොළී අනුපාත ලබා දෙනුයේ කෙටි දින ගණනකට වලංගු වන සේ බැවින් නැවතත් මහා සභා අනුමැතියකින් තොරව ප්‍රසම්පාදන තීරණය අනුව ඉහත ස්ථාවර තැන්පතු ආරම්භ කිරීමට සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**<u>(05.4) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව අංක 07/05/08/03 දරණ යෝජනාව</u>**

2025 වර්ෂයට අදාලව ගිණුම් පියවීම් සහ සියලු රාජකාරී කටයුතු අවසන් කිරීමට සිදුවන බැවින්, 2025 දෙසැම්බර් මස 11 දින මහ සභාව පැවැත්වීමට අනුමත කරගත් දිනය සංශෝධනය කරමින්, 2025 දෙසැම්බර් මස සිව්වන සතියේ 23 වන අඟහරුවාදා දින පෙ.ව.9.30 ට මහ සභාව පැවැත්වීම සුදුසු බවත්, දෙසැම්බර් මාසයට අදාලව කමිටු පැවැත්වීම 23 සහ 24 දිනයන්වල පැවැත්වීමට සැලසුම් කළද එම දිනයන්ද සංශෝධනය කරමින් නිවාස හා ප්‍රජා සංවර්ධන සහ පරිසර හා පොදු පහසුකම් කාරක සභා 2025.12.10 දින සහ කර්මාන්ත සහ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා 2025.12.11 දින පැවැත්වීමත් සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2025 වර්ෂයට අදාලව ගිණුම් පියවීම් සහ සියලු රාජකාරී කටයුතු අවසන් කිරීමට සිදුවන බැවින්, 2025 දෙසැම්බර් මස 11 දින මහසභාව පැවැත්වීමට අනුමත කරගත් දිනය සංශෝධනය කරමින්, 2025 දෙසැම්බර් මස සිව්වන සතියේ 23 වන අඟහරුවාදා දින පෙ.ව.9.30

ට මහසභාව පැවැත්වීම සුදුසු බවත්, දෙසැම්බර් මාසයට අදාලව කමිටු පැවැත්වීම 23 සහ 24 දිනයන්වල පැවැත්වීමට සැලසුම් කළද එම දිනයන්ද සංශෝධනය කරමින් නිවාස හා ප්‍රජා සංවර්ධන සහ පරිසර හා පොදු පහසුකම් කාරක සභා 2025.12.10 දින සහ කර්මාන්ත සහ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා 2025.12.11 දින පැවැත්වීමත් සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

## <u>06.කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම</u>

### (6.1) <u>2025.10.21 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව</u>

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2025.10.21 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, 2025.10.21 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2025.10.21 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

### (6.2) <u>2025.10.21 දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම් වාර්තාව</u>

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2025.10.21 දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, 2025.10.21 දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2025.10.21 දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

### (6.3) <u>2025.10.22 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව</u>

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2025.10.22 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, 2025.10.22 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2025.10.22 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

### <u>(6.4) 2025.10.22 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව</u>

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2025.10.22 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, 2025.10.22 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2025.10.22 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**(6.5) <u>2025.10.17, 2025.11.07 සහ 2025.11.13 දිනයන්හිදී පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තා</u>**

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2025.10.17, 2025.11.07 සහ 2025.11.13 දිනයන්හිදී පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තා ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, 2025.10.17, 2025.11.07 සහ 2025.11.13 දිනයන්හිදී පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තා සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2025.10.17, 2025.11.07 සහ 2025.11.13 දිනයන්හිදී පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තා ඒකමතිකව සභා සම්මත විය.

**<u>07. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තා සහ වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම</u>**

**(07.1) <u>2025 ඔක්තෝම්බර් මාසය - ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව</u>**

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 ඔක්තෝම්බර් මාසය ප්‍රා.ස.14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 ඔක්තෝම්බර් ප්‍රා.ස.14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනිම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. කරුණාරත්න මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා

ඒ අනුව, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 ඔක්තෝම්බර් මාසය ප්‍රා.ස.14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**(07.2) <u>2025 ඔක්තෝම්බර් මාසය -ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශ සහ ආදායම් පුරෝකථන වාර්තාව</u>**

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 ඔක්තෝම්බර් මාසය ප්‍රා.ස.16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 ඔක්තෝම්බර් මාසය ප්‍රා.ස.16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව පිළිගැනිම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. කරුණාරත්න මැතිතුමා**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මා ස්ථිර කරනවා

ඒ අනුව, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 ඔක්තෝම්බර් මස ප්‍රා.ස.16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**(07.3) 2025 වර්ෂයේ දෙවන කාර්තුවට අදාළ ජූලි, අගෝස්තු සහ සැප්තැම්බර් මාසවලට අදාළ ආදායම් අයකර ගැනීම හා හිඟ ආදායම් පිළිබඳ මාසික ප්‍රකාශය**

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 වර්ෂයේ තෙවන කාර්තුවට අදාල ජූලි, අගෝස්තු සහ සැප්තැම්බර් මාසවලට අදාල ආදායම් අයකර ගැනීම හා හිඟ ආදායම් පිළිබඳ මාසික ප්‍රකාශ ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමනි, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 වර්ෂයේ තෙවන කාර්තුවට අදාල ජූලි, අගෝස්තු සහ සැප්තැම්බර් මාසවලට අදාල ආදායම් අයකර ගැනීම හා හිඟ ආදායම් පිළිබඳ මාසික ප්‍රකාශ පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාශීය සභා මන්ත්‍රී කේ.ඒ. කරුණාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා

ඒ අනුව, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 වර්ෂයේ තෙවන කාර්තුවට අදාල ජූලි, අගෝස්තු සහ සැප්තැම්බර් මාසවලට අදාල ආදායම් අයකර ගැනීම හා හිඟ ආදායම් පිළිබඳ මාසික ප්‍රකාශ ඒකමතිකව සභා සම්මත විය.

**08. වෙනත් කරුණු**

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු මන්ත්‍රීවරුනි, වෙනත් කරුණු සඳහා අවස්ථාව ලබා දෙනවා. ඒ අනුව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නාරද සිරිවර්ධන මැතිතුමාට අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමනි, වැලිගම ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමාගේ ඝාතනය අපි කාටත් දැනුන දෙයක්. මේ සභාපතිතුමාට අපරාධ තියනවා උසාවි නඩු තියනවා කියලා චෝදනා කරනවා නම්, ඒ නිසා ශෝකය ප්‍රකාශ කරන්න බැහැ කියලා කියනවා නම් ජනතා විමුක්ති පෙරමුණේ විශාල සංඛ්‍යාවක් ඉන්නවා ලාල් කාන්ත ඇමතිතුමා ප්‍රසිද්ධියේ කියනවා, ඉස්සර මම ට්‍රාන්ස් ෆෝමරේ කඩනකොට ලයිට් නැති වෙනකොට මට ඒ ගැන බොහොම සතුටුයි කියලා. රජයේ දේපල විනාශ කරපු අය කියන කතා. වැලිගම ගරු සභාපතිතුමාගේ ඝාතනය පිළිබඳ අපේ සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරු පස් දෙනාටම හරිනම් කතා කරන්න දෙන්න ඕනි. මම ඉල්ලා සිටිනවා ඒ අවස්ථාව ලබා දෙන්න කියලා. ඇත්තටම එතුමා ප්‍රජාතන්ත්‍රවාදීව ප්‍රදේශයෙන් ඡන්දයට ඉදිරිපත් වෙලා විශාල ඡන්ද සංඛ්‍යාවක් ලබාගෙන ලොකු ආන්දෝලනයකින් තමා එතුමා සභාපති වශයෙන් පත්වුණේ. මේ සභපතිතුමාට නඩුවත් තියනවා කියලා හරියටම වැරදිකරු වෙන් නැහැ. නමුත් මෙතුමා වැරැද්දක් කරා නම් ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයට අනුව එතුමාට ඒ දඬුවම ලැබෙනවා. නමුත් තීන්දුව දෙන්න කලින් මේ රටේ ආරක්ෂක ඇමතිවරයා මානසිකව දඬුවමක් එල්ල කරනවා එයාට පාතලය සමඟ සබඳතා තියනවා එයාට නඩු තියනවා කියලා එයාගේ චරිතය සහමුලින්ම ඝාතනය කරලා දැම්මා. ඝාතනය කරපු එක හොඳයි වගේ නොකියා කියනවා. ඒවා උසාවියකින් කළ යුතු වැඩ. රටක ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් කටයුතු කරන නායකයන්ගෙන් නොවිය යුතු දෙයක් විදිහට දකිනවා. එදා ඔබතුමාලාගේ රජය යටතේ අපේක්ෂකත්වයට පෙනී සිටියා එදා මේ මේ අකටයුතුකම් නිසා දෙන්න බැහැ කියලා කියන්න තිබුණා. නමුත් එතුමා ඝාතනය වුණාට පසුව එතුමාට විවිධ චෝදනා එල්ල කරමින් මානසිකව ඝාතනය කරනවා. ඒක අපි තරයේ හෙලා දකිනවා. මෙලෙස විධිමත් විදිහට මෙම ශෝක ප්‍රකාශය ලේකම්තුමිය හරහා ඉදිරිපත් කරලා මේ විදිහට ප්‍රතිචාර ලැබෙයි කියලා හිතුවේ නැහැ. ඒ ගැන විශේෂයෙන්ම කණගාටු වෙනවා. අපි අයවැයේත් ඔබතුමාට විරුද්ධ නොවී සහයෝගය දුන්නා. මීට පසුව අපි යම් යෝජනාවක් කරනවා නම්, ඒ ගැන ගැඹුරින් සොයා බලා කරුණු කාරණා පිළිබඳව අවබෝධයෙන් කටයුතු කරනවා නම් හොඳයි කියලා මම ඉල්ලීමක් කරනවා. අපේ වැරැද්දක් තියේ නම් ඒක පෙන්වා දෙමින් සාධාරණව කටයුතු කළ යුතුයි. නැතුව සමාජ මාධ්‍ය තුළ මෙම පුද්ගලයා  අපරාධකාරයෙක් කියලා ප්‍රචාරය වීම හේතුවක් ලෙස සැලකීම කොතෙක් දුරට සාධාරණද කියලා මම දන් නැහැ. එක පැත්තකින් පක්ෂග්‍රාහී වෙනවා. මිය ගිය දවසේම රජයේ වගකිය යුතු නිලධාරියෙක් පෙර කීව පරිදි නිවේදන නිකුත් කරනකොට පක්ෂග්‍රාහී දෙයක් ලෙස මම සලකනවා. ඒ නිසා තමා ඒකාබද්ධ විපක්ෂයක් හැටියට විරෝධය ප්‍රකාශ කරන්නේ.

විශේෂයෙන්ම වැලිගම ප්‍රාදේශීය සභාවේ හිටපු ගරු සභාපති ලසන්ත වික්‍රමසේකර මැතිතුමාගේ මරණය සම්බන්ධයෙන් අපි සියලු දෙනාගේම කණගාටුව ශෝකය ප්‍රකාශ කරමින් එතුමාට නිවන් සුව අත් වේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමනි, වෙනත් කරුණු කතා කරන්න පෙර පොඩි කාරණාවක් පිළිබඳව අවධානය යොමු කරන්න තියනවා. අපේ අලව්ව සතිපොල එක්සත් අනුබද්ධ වෙළඳ සංගමය සහ මරණාධාර සමිතියෙන් කියලා මන්ත්‍රීවරුන්ට ලිපියක් අපිට ඉදිරිපත් කරලා තියනවා. මෙම ප්‍රශ්නය පිළිබඳව අවධානය යොමු කරාම අපි කියන කාරණාවටත් ඇහුම්කම් දීලා එදා ඔබතුමා කීවා මන්ත්‍රීවරුත් සමඟ සාකච්ඡාවක් තියලා ඒ තීරණයක් පොළේ වෙළෙන්දන් සමඟත් සාකච්ඡා කරලා විධිමත් තීරණයක් ගන්නවා කියලා. ඒ සම්බන්ධවයි ඔබතුමා සමඟ කතා කරන්නේ. අපිත් සමඟ සාකච්ඡාවක් නොකර සතිපොල හදන බවට අපිට ලිපියක් යොමු කරලා තියනවා. මම කියන්නේ ලිපිය තිබෙන කාරණා මත පමණක්ම පදනම්ව නෙවේ. මේ ලිපියේ සෙනසුරාදා දින ඉදි කිරීමක් සම්බන්ධව තියනවා ඉතින් ඒ සම්බන්ධව සාකච්ඡාවකට අපිව දැනුවත් කරලත් නැති නිසයි කතා කරන්නේ.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු මන්ත්‍රීවරුනි, ගැටලුවක් නැහැ දැන් ඒ සාකච්ඡාව ගමු. ඒ ඉදි කිරීම් කටයුතු සඳහා මුදල් අනුමත කරගෙන තිබ්බා දෙසැම්බර් 31 වන විට අවසන් කරන්න ඕනි. ඒක වෙනම තාක්ෂණික ක්‍රියාවලියක් නිසා ඒ ඉදි කිරීම් කටයුතු යනවා. ගිය සභා වාරයේදීත් දීර්ඝ ලෙස පැහැදිලි කිරීමක් සිදු කළා. ඊට අමතරව මොනවා හරි පැහැදිලි කිරීමක් අවශ්‍ය නම් ඒ සාකච්ඡාවත් සිදු කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ජී. නාරද සිරිවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ඒ සම්බන්ධව මන්ත්‍රීවරුන්ගේ අත්සනින් යුතුව ලිපියක් භාර දුන්නා. ඒත් ඒ ලිපිය ඉදිරිපත් වුණේ නැහැ. ඒ කියන එළිමහන් තැන හදනවා නම්, හදන්න තැන් තියනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු මන්ත්‍රීවරුනි, ප්‍රථමයෙන්ම මන් පැහැදිලි කිරීමක් කරන්නම් මොකක්ද කරන්නේ කියලා. ඉදිරියට ලොකු වහලයක් එන්නේ නැහැ. අඩි 40ක ප්‍රමාණයක වහලහයක් තියන ගොඩනැගිල්ලට සමගාමීව ඉදිරියට ගේනවා. ඔබට මතක ඇති පරණ පොළ තිබුණේ මංතීරු හතරකටයි. මුලින් පාරිභෝගිකයෙක් ඇතුළු වුණොත් කෙලවරටම යන්න පුළුවන්. අලුත් ඉදි කිරීමත් සමඟ මංතීරු හතර අයින් වෙලා වටෙන් යන ආකාරයට තමා පොල බෙදුවේ. ඒක ඉදිරිපස තොග වෙළෙන්දන්ට දීලා පාරිභෝගිකයන්ට කෙලවරට යන්න බැහැ. මගේ අරමුණ වුණේ පොල ඉදිරියට අරගෙන, ඒ ඉඩකඩ සමඟ පරණ පොල තිබ්බ විදිහට හදන්න. වෙළෙන්දෝ ස්ථාන ගත කිරීම ඇතුලුව ඊට අදාල පරණ පොලේ සියලු සැලසුම් තියනවා. ඒ පොල මංතීරු හතරට පෙර පරිදිම හදන එක තමා මගේ අරමුණ. පොලේ ඉස්සර බඩු විකිණුනේ පසුපසු තොග වෙළෙන්දන්ගේයි. ඒගොල්ලන්ගේ බඩුවල ගණන් අඩුයි. ඒ කාලයේ තොග වෙළෙන්දෝ බඩු ගෙනාවේ ඒ ගොල්ලන්ට තියෙන ඉඩකඩ ප්‍රමාණය අනුවයි. මේ පාර කරපු වැරැද්ද තමා ඉදිරිපස තොග වෙළෙන්දන්ට දුන්නා. එයාලට නීතියකුත් දැම්ම රාත්‍රියේ තොග වෙළඳාම් කරන්න එළවළු විකුණනකොට ඇතුල් පැත්තට විකුණන්න කියලා. දැන් ඒ නීති මොකවත් නැහැ. කඩ දෙක ගත්ත කෙනා ඉස්සරහින් අල්ලගෙන කඩ හතරක ප්‍රමාණයක් අල්ලගෙන, ගේන බඩු ප්‍රමාණයත් වැඩි කරන්. එදිනෙදා එළවළු ටික විකුණන අහිංසක මිනිස්සුන්ගේ සහ තොග අයගෙන් බඩු අරන් කරන අයට රස්සාව කර ගන්න විදිහක් නැහැ. පාර තියෙන්නේ ඇතුළේ නිසා ඇතුල් පැත්තේ එළවළු විකුණගන්න ඕනි. ඔබතුමාලට සමිතියක් ලිපියක් ඉදිරිපත් කරලා තියනවානේ ඇත්තටම කීවොත් නම් වශයෙන් හිටපු මන්ත්‍රී නලින් ඉන්නවා. එතුමාට ඉස්සර පොලේ කඩ තිබුන් නැහැ. එතුමා එළියේ පේමන්ට් එකේ බඩු දැම්මේ. නමුත් මේ පොල හදනකොට එළියේ හිටපු කෙනාට කඩ දෙකක් හම්බ වුණා. ඒකටවත් අපි විරුද්ධ වුණේ නැහැ. එයා දැන් ඉදිරියටත් කඩ දෙකක ප්‍රමාණයක් දාගෙන කඩ හතරක ප්‍රමාණයක් භුක්ති විඳනවා. සාමාන්‍ය මනුස්සයින්ට වර්ග අඩි 35යි තියෙන්නේ. මගේ ගෝලයෝ දෙන්නෙක් අයින් කරා. අපි සභාවේ කියලා කාවදාවත් දශමයක වංචාවක් කරලා නැහැ. වර්ග අඩි 35 ක මම ඉන්නේ. නලින්, මගේ මල්ලී, එයත් ඉදිරියෙන් පේමන්ට් එක අල්ලගෙන ඉන්නවා. අපි මේක ගිහින් බලමු. වැරදියට අවබෝධ කර ගන්න එපා. සුපුන් කියන පුද්ගලයාටත් කඩ තිබුන් නැහැ. එයා තුල්හිරියේ අල ළූණු විකුණන සරත් කියන මුදලාලි ළඟ වැඩ කළේ. අලුතෙන් පොල හදලා ඇතුළෙන් එයාට කඩයක් දෙනවා.

දැන් එයා පාර හරස් කරලා අල පැණු ලොරියක් ගෙනල්ලා දානවා. කඩයක් තිබුණේත් නැහැ ඒත් කඩයක් ඇතුළේ තියෙද්දී තමා පාරෙත් දාන්නේ. සුපුන් තමා ලේකම්, නලීන් සභාපති සහ භාණ්ඩාගාරික ඒ තුන්දෙනා ලිපියක් යොමු කරනවා. ඒගොල්ලන්ගේ කඩවල් අහිමි වෙයි කියලා බයේ ඉන්නවා මම ඔය හොරට ගත්ත කඩවල් එකක්වත් ගන්න යන් නැහැ. චූටි පුතාට තිබ්බේ කඩ දෙකයි දැන් කඩවල් අටක් තියනවා. ඒක ඔය විදිහට ආවොත් මම පටන් ගන්නේ කඩවල් හොරකම් කරපු තැන ඉඳලා. මම කරන්නේ සද්භාවයෙන් සියලු දෙනාටම සාධාරණයක් වෙන විදිහට පොල වෙනස් කරලා දෙන්නයි. මංතීරු හතරට ඉන්න තැන ඉඳලා අනිත් පැත්තට හැරෙන්නයි තියෙන්නේ. කාගෙවත් හොරට ගත්ත කඩ ගන්න යන් නැහැ. මෙතන ගැටලුවක් ඇති කරන් නැහැ, සාධාරණයක් කරන්න යන්නේ. භාගෙට භාගයක් අපේ ඥාතියෝ තමා පොලේ හිටියේ ඒ ගොල්ලෝ තමා ඉස්සර ඉදිරියේ හිටියේ. ඒසියලු දෙනා පිටිපස්සට දැම්මා. ඒ හිටපු මිනිස්සුන්ට ඒ තැන දෙනවා මිසක් වෙන කාටවත් ආයේ ඒ කඩවල් දෙන්න යන් නැහැනේ. අඩි 40ක් එනවා කඩ 18ක් විතර එනවා. ඉදිරියෙන් හිටපු අයට එතෙන්ට එන්න කියනවා. ඇතුළේ ඉඩ එන නිසා එළියේ හිටපු අයට එතෙන්ට එන්න කියනවා. එතකොට එළියේ කාටවත් බඩු දාන්න බැහැ එළියේ හොඳට පාර්කින් එක හැදෙනවා. මංතීරු හතරට හදනවා. ඔච්චරයි කරන්නේ. මම ජීවිතේට පෞද්ගලිකව වැඩ කරන් නැහැ. තුන්ඩු උඩ දාලා හම්බුන කඩ තමා මම අරන් තියෙන්නේ. දැන් ඉන්න තැන මට හොඳයි. මේක වෙනස්කරාම ආර්ථික පැත්තෙන් මට පාඩුයි. නලීන්ගේ, මගේ මල්ලීගේ, සුපුන්ගේ, චූටි පුතාගේ හොරට ගත්ත කඩ අට ගන්න යන්නේ නැහැ. ඒවා මම ස්භාව දහමට භාර දීලා තියෙන්නේ. ඒ නිසා මේවට වැරදි විදිහට ඔබතුමන්ලා සම්බන්ධ වෙන්න එපා. මුදල් අනුමතකර ගත්තෙත් බොහොම අමාරුවෙන්. ඒක ලේකම්තුමියවත්, දේශපාලන නායකත්වයවත් දන්නැහැ. අනිද්දා වැඩේ පටන් ගන්නවා. වහලය ගහලා ඉදිරියට ගන්නවා. මගේ පෞද්ගලික වරප්‍රසාදයක් වෙනුවෙන් මම තීන්දු තීරණ අරගෙනත් නැහැ අරගන්නෙත් නැහැ. මම වැරැද්දක් කරන් නැහැ මා තේරුම් ගන්න එච්චරයි මට කියන්න තියන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ඔබතුමා දීර්ඝ විස්තරයක් කරා. ඒක පිළිගැනීම සාධාරණද නැද්ද කියලා තීරණය කරන්න අපි ඒක බලන්න ඕනි. අනිත් කාරණය තමා මෙම ලිපිය ඉදිරිපත් කරාම වැදගත් විදිහට සභාවට ඉදිරිපත් කරා ඒවෙලාවේ ඔය දීර්ඝ විස්තරය කරා නම් හොඳයි. සෙනසුරාදා මුල්ගල තියන්න පටන් ගන්න හදන්නේ එතකොට මෙම ලිපිය අද ඉදිරිපත් කරන නැතුව මම කොහෙටද ඉදිරිපත් කරන්නේ. සභාපතිතුමත් එක්ක කතා කරන්න ඕනිනේ. ඔබතුමා මේ සම්බන්ධව සාකච්ඡාවක් දෙනවා කියලා කීවානේ ඒක ලබා දුන් නැහැනේ. ඒක සාධාරණද බලන්නකෝ.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමා, මම මේ සම්බන්ධයෙන් එදා මහ සභාවේ විස්තර කරානේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමා, මේ ලිපියේ කාරණා පහ හයක් ඇතුළත් කරලා තියනවා. මේවා ඇත්තද නැද්ද කියලා බලන්න ඕනි නැද්ද. විපක්ෂයක් විදිහට ඔබතුමා කියන දේවල් අහන් ඉඳලා ඔක්කෝටම අත උස්සන එකද කරන්න ඕනි? මේකේ තියනවා ක්‍රමවත්ව පාරිභෝගිකයන් පැමිණීම බඩු පැටවීම, මිලදී ගැනීම යන අවස්ථාවලදී වාහන ගාල් කිරීම වැනි ස්ථාන ජනතාවට නැතිකිරීම. ඒක පළවෙනි එක.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමා, ඔය කියන කාරණයට උත්තර දෙන්නම්කෝ. පෙරට වඩා වැඩි පාර්කින් ප්‍රමාණයක් එනවා. එළියේ ටෙන්ට්, ඉටිරෙදි ගහගෙන ඉන්න ඔක්කෝම ඇතුළට එනවා. එතකොට පාර්කින් එක පෙරට වඩා ඉඩ වැඩි වෙනවා. ඒවා නැතුව යන් නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමා, අපිට කරුණු පැහැදිලි කරාට මේ ලිපිය දාලා තියන අයත් සමඟ සාකච්ඡාවක් දුන්නා නම් හොඳයි.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමා, පොලත් එක්ක මම ඒක සාකච්ඡා කරන් නැහැ. ඔය සමිතියේ තුන් දෙනාත් එක්ක සාකච්ඡාවත් අවශ්‍ය නැහැ. මම ඒ තුන්දෙනා ගැන හෙළිදරව් කරානේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**
ගරු සභාපතිතුමනි, දෙවනි කාර්ණය මේකයි. දැනට සකස් වී ඇති වෙළඳ සහ පාරිභෝගික සහයෝගිතාවය මෙම හේතුවෙන් බිඳ වැටීම.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමා, ඒකටත් උත්තරයක් දෙන්නද මේ වෙනස කරලා දෙන්න කියලා කරපු 40ක් 50ක් අත්සන් කරපු ලේඛනයක් මම ළඟ තියනවා. දැන් ඔය තුන්දෙනාගේ ලියුම දෙන්නේ. මේ වෙනස කරලා දෙන්න කියලා නිරවුල් කරාලා දෙන්න කියලා පොලේ අය කරපු ඉල්ලීම තියනවා. මම ඒක සභා ගත කරන්නම්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මේක තුන්දෙනෙක් නෙවේ කරලා තියෙන්නේ සතිපොල ඒකාබද්ධ වෙළඳ සංගමය කියලා එකකින් ඉදිරිපත් කරලා තියෙන්නේ.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමා, මම මේ කරන වැඩේ ගැන පොලේ අයට දැනුවත් කරනවා. පොලේ අය ඔක්කෝම එකතු කරලා කතා කරනවා. ඔය තුන් දෙනත් එක්ක කතා කරන්න යන් නැහැ. මුදල් ආපසු යන නිසා මේක කරන්න කියලා තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඔබතුමා එතන කරුණු පැහැදිලි කරාට විපක්ෂයේ අපි මොකුත් දන් නැති වුණාම අපි මොනුන්ද කියලා අහන් නැද්ද? අනිත් කාරණය පහල මහලේ කපරාදු නොකර ඇති අතර විදුලිය අක්‍රමවත් ලෙස සපයා ඇත. එසේ ගැටලු තිබියදී වෙනත් කටයතු සිදු කිරීම සම්බන්ධයෙන් විරෝධය දැක්වීම. අනිත් කාරණය තමා අලව්ව ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලය ඉදි කිරීම වර්තමානයේ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යයක් ලෙස අපි දකිමු. ඊට හේතුව ලෙස අප විසින් පෙන්වා දෙනු ලබන්නේ දැනට පෙර තිබූ කාර්යාලයෙන් ඉවත් වී ප්‍රජා ශාලාවේ ගොඩනැගිල්ලට ප්‍රධාන කාර්යාලය ගෙන ගොස් එහිදී පරිපාලන කටයුතු සිදු කරනු ලබයි කියලා තියනවා. ඒ කාරණය අපිට අදාල නැහැ.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීවරුනි, මේ ශාලාව හදන්න පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවෙන් අනුමත කරගෙන මෙම වැඩේට සිදු කරන්න මුදල් තියනවා. ප්‍රශ්නය තියෙන්නේ තැන පිළිබඳවයි. කාර්යාල ගොඩනැගිල්ල සභාව තියන තැන හදමු ඒක මහ සභා අනුමැතියකට දාලා තීන්දුවක් ගමු කියලා අපි ලේකම්තුමියත් සමඟ සාකච්ඡා කරා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මේකේ ගැටලුව තියෙන්නේ මේ කාටවත් නෙවේ. මේ සම්බන්ධයෙන් ඔබ තුමා කීව විදිහට අපිට සාකච්ඡාවක් දිලා කටයුතු කරානම් ප්‍රශ්නයක් නැහැ.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමනි, මම සාකච්ඡාවක් දෙනවා කීවා නම් මට ඒක මඟාරින්න අවශ්‍යතාවයක් නැහැ. එදා ලොකුවට පැහැදිලි කරපු නිසා අවශ්‍ය නෙවේ කියලා හිතුවා. කිසිම කෙනෙක්ට මේකෙන් අසාධාරණයක් කරන්න නෙවේ හදන්නේ. ඇත්තටම අනිත් අයට බයක් තියෙන්නේ තමන් අත්පත් කරගත්තු ඒවා නැති වෙයි කියලා, මම ඕවා නැති කරන්න යන් නැහැ. ඒක ස්භාව ධර්මයට ඉඩ දීලා තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඔබතුමා යහපත් තැනට ආවා නම් අපිත් නිකම්ම එනවා.
ඔබතුමා පොරොන්දු වුණ විදිහට සාකච්ඡා කරා නම් මේ විදිහට කටයුතු කරන්නේ කියලා පැහැදිලි කරා නම්, අපි මේක මෙච්චර ඉක්මනට කරයි කියලා හිතුවේ නැහැ. ක්ෂණිකව පණිවිඩයක් දුන්නා නම් අපි ඇවිල්ලා බලනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීවරුනි, තාක්ෂණිකන නිලධාරීන්ටත් කෑ ගහලා තිබුණා මේකට මුදල් වෙන් කරලානේ තියෙන්නේ මේ වැඩේ ඉක්මනින් වෙන්න ඕනි කියලා මොකද චෙක් ලියන්න ඕනි සල්ලි ටික ආපසු යන නිසා බලපෑම් කරා. ඒනිසා තමා මේක ඉක්මන් කරේ. ඒක තේරුම් ගන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මේක සභා අනුමැතියක් ලැබුණ විදිහටද කරන්න යන්නේ?

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමා, මේක ගියවර සභාවට දාලා අනුමැතියක් අරන් තියෙන්නේ. එවෙලාවේ සම්පූර්ණව පැහැදිලි කිරීමක් කරානේ. එදා කීවානේ සාකච්ඡාවක් දෙන්නම් කියලත් .

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මට නම් තේරෙන්නේ මේක අනවබෝධයෙන් කරන වැඩක් කියලා. ඔබතුමාට මීට වඩා කරන්න තිබ්බා අපි මේ වැඩේ කරනකොට ඊර්ෂ්‍යාත් නැහැ කකුළෙන් අදින්නෙත් නැහැ. මම නම් දකින්නේ වඩාත් හොඳ සංවර්ධනයක් මෙතෙන්ට වෙන්න ඕනි. නාරද මන්ත්‍රීතුමත්, අපේ මන්ත්‍රීවරුත් කියනවා සභාපතිතුමත් කියනවා මේ ලිපිය 100%ක්ම ඇත්ත නොවෙන්න පුළුවන්. බොරු නොවෙන්නත් පුළුවන්. අපි මේක සාකච්ඡා කරලා කිසි කෙනෙකුට අසාධාරණයක් නොවෙන්නත්, එතන ඉන්න සියලුම වෙළෙන්දන්ට යහපතක් වෙන්නත් මේ සංවර්ධනය කර ගත්තොත් තමා වටින්නේ. මේ කරන්න කලින් අපි 24 දෙනාටම එන්න කියලා පොලට ගිහිල්ලා නිරීක්ෂණයක් කරා නම් තමා අපිට තේරෙන්නේ. ඔබතුමාට ස්ථානීය අවබෝධය තිබ්බට අපිට ඒක නැහැ. අපේ ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරු සියලුම දෙනා දන්නවා ඕක නිර්මාණය කරද්දී කලින් අදහසක් තිබ්බා බහුවිධ මධ්‍යස්ථානයක මට්ටමට ආවනේ.පොල තමා අපේ අංක එක, අපි බහුවිධ මධ්‍යස්ථානයෙත් ගන්න පුළුවන් ටිකත් රැකගෙන කටයුතු කරමු.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීවරුනි, මම ඔබතුමාලට ගෞරවයෙන් ආරාධනා කරනවා සෙනසුරාදා උදේ මගෙත් එක්ක ඔය වැඩේට සම්බන්ධ වෙන්න කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, අපි 25 දෙනාම එමු. අද හෝ ඊට කලින් බැලුවා නම් අපිට තියන අනවබෝධය ඉවත් වෙනවා. සමහර විට ඔබතුමා කරන හොඳම වැඩේ වෙන්නත් පුළුවන්.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීවරුනි, ඇත්තටම විවෘත ආරාධනාවක් කරනවා සියලුම මන්ත්‍රීවරුන්ට සෙනසුරාදා උදේ එන්න එතකොට සියැසින් බලා ගන්න පුළුවන්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මන් කියන්නේ සභාපතිතුමා අද ඉන්න ටිකත් එක්ක ගිහින් පැහැදිලි කරන්න බැරිද? කාටවත් අසාධාරණයක් නොවෙන්න වඩා ඵලදායී දෙයක් කරයි කියලා අපි විශ්වාස කරනවා. ඔබතුමා සමඟ අපිට ගැටුම් ඇති කරගන්නවත් ඕනි නැහැ. කාටවත් අසාධාරණයක් වෙනවටවත් කැමති නැහැ.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීවරුනි, මම කීවනේ කාගෙවත් දේවල් ගන්න යන් නැහැ කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**
ගරු සභාපතිතුමනි, දෙන්නා තුන්දෙනා වෙනුවෙන් අපිට කතා කරන්න ඕනි නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, අපිට ඕනි සියලු දෙනාටම යහපත් වෙන්නයි. කවුරුත් වෙළෙන්දෝ කවුරුත් හම්බ කරන්න උත්සාහ කරන්නේ ජීවත් වෙන්නයි.
ඔබතුමා කීවා ඔබතුමාගේ මල්ලීත් කඩ දෙකක් අල්ලන් ඉන්නවා කියලා. අවංකව කීවානේ ඒකට අපි ගරු කරනවා. මගේ සහ බහුතර මන්ත්‍රීවරුන්ගේ අදහස කාටවත් අසාධාරණයක් නොවෙන්න අපි මේ බලාපොරොත්තු වෙන බහුවිධ මධ්‍යස්ථානයත් ආරක්ෂා වෙන විදිහට අපිට ඕනි තව තවත් දියුණු වෙන්න ඉදිරියට යන්න අවශ්‍ය සංවර්ධනයක් කරලා දෙන්න කියලා ඉල්ලා සිටින්නේ. මට සහභාගී වීමට නොහැකි වුවත් අනිත් ඉන්න අයට ඔබතුමා ගිහින් ස්ථානිය නිරීක්ෂණයක් සිදු කරලා පැහැදිලි කරලා දෙන්න. එතකොට තේරෙයි. එතකොට ප්‍රශ්නය ඉවරයි. ජය වේවා කියලා පතනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මන් හිතන්නේ අපේ මන්ත්‍රීවරු දෙන්නා වගේම අනිත් මන්ත්‍රීවරු දහදෙනාගේත් අදහස වෙන්නේ පොලේ ඉන්න කට්ටිය ගෙන්නලා අපේ මන්ත්‍රීවරුත් එක්ක සහ සම්බන්ධ වෙලා මේ කටයුත්ත කරනවා නම් හොඳයි කියලා. මම සභා වාර්තාව විවෘත කරන් නැහැ. ඔබතුමා තීන්දු තීරණ ගන්නවා නම් වැඩක් නැහැනේ සභා වාර්තාව කඩලා මෙතෙන්නට එන එක. පුදුම කලකිරීමක් තියෙන්නේ. ලයිට් එක සවි කරාම කොහෙවත් ඉන්න මනුස්සයෙක් ඇවිත් අතුකෝරාල මන්ත්‍රීතුමා ඔන්න ඔයාගේ ලයිට් ටික දැම්මා කියනවා. මම මන්ත්‍රී, කොහෙද අපි මේ ඉන්නේ. ඊට වඩා හොඳයි ඔයාලාගේ කාර් ඔයාලගේ පැට්‍රල් ඔයාලම පැදගෙන යන්න කියලා කියන්න වෙන්නේ. අපි සභා වාර්තාවක් කියවන් නැහැ කිසිම දේකට අංචි අදින් නැහැ. වැඩේ කරගෙන යන්න ඔබතුමාට මතක නම්, පළමුවර පොලේ සල්ලි ආපසු ගියේ ඔබතුමා යෝජනාවක් ගෙනාවා සම්පූර්ණයෙන් අපි ඒකට ඔබත් එක්ක හිටියා. කෝටි ගාණක් සල්ලි ආපහු ගියා. එතකොට අපි ආණ්ඩු පක්ෂයේ හිටියත් ඔබතුමා කියන දේවල්වලට අනුගතවෙලා හිටියා. යුක්ති සහගතද දැන් මොනවත් නැතුව අපිව පැත්තකට තල්ලු කරලා දාන එක. මට නම් ගැටලුවක් නැහැ. මනුස්සයෙකුට මොනවා හරි අවශ්‍ය දෙයක් කරා පැත්තකට වෙලා හිටියා. සංවර්ධන කටයුතු සඳහා ලක්ෂ තුන හමාර මට දෙන් නැත්නම් ඒත් එපා. දේශපාලනයේදී අපි දන්නවා කරන්න ඕනි දේ ඊළඟ පාරට, හතර වෙනි අවුරුද්දේදී අපි පටන් ගන්නවා. සල්ලි ප්‍රශ්නයක් නැහැ. මුලදී ඔබතුමාලා කීවා අපි බොහෝම සුද්දයි පොහොට්ටුවේ ඉන්නේ හොරු කියලා දැන් මාලිමාවෙත් එහෙම අය ඉන්නවානේ. මේක කුලකයක්. අපි අවබොධයෙන් තේරුම් අරන් කතා කරන්න ඕනි. පළමු වරම මන් ඉල්ලීම කරා ඔබතුමා එක්ක සද්භාවයෙන්ම කටයුතු කරමු කියලා. අපිට යන්ත්‍ර සූත්‍ර ටික දෙන්න. උදාහරණයක් ගත්තහම ගරු මොහාන් මන්ත්‍රීතුමා ගලතරය පාර කැඩිලා තියෙද්දී, හිටපු ගරු සභාපතිනිය පද්මා මැතිනිය මාත් එක්ක තරහයි. ඒ කැබ් එකට අනුමැතිය ඉල්ලුවා අපි දුන් නැති නිසා. හැබැයි ගලතරය පාර සංවර්ධන කරද්දී පද්මා නෝනාට කතාකරලා වාහන දෙක ඕනි කියලා ඉල්ලීම කරාම පක්ෂ බේදයක් බැලුවේ නැහැ වාහන දෙක එව්වා. ලක්ෂ පනහක වැඩක් කරා. ඔබතුමා දන්නවාද මම මුලින් ම ඉල්ලුවා අපි ස්වාධීන මන්ත්‍රීවරයෙක් විදිහට ඉල්ලීම කළේ. ඔබ තමුන්නාන්සේලාට ඡන්දයක් තිබ්බා නම් ඔබතුමාලාට මම හොඳයි. මම ඡන්දය දීලා 13 ට 14 තිබ්බා නම් එතකොට ඔබතුමාලාට අතුකෝරාල මන්ත්‍රීතුමා සුපිරි චරිතයක් වෙනවා. හොරා සීල් එක ගහන්න බැහැ හොරකම් කරලා නැති නිසා. මන් කියන්නේ සමුපකාර ඡන්ද ටික තිබ්බහම ගම්වල මිනිස්සු මොනවාද කරන්නේ කියලා තව ටික දවසකින් තේරෙයි. ඔබතුමාලා බලන්නකෝ කිසිම ගැටුමක් නැතුව ඔහොම අයවැයක් සම්මත කළේ කොහෙද කියලා. අපි අයවැය සම්මත කරලා දුන්නේ මාලිමාවට නෙවේ පරණගම කියන සභාපතිවරයාටයි. අපි උදව් කරන්නේ චමින්දමාල් කියන මන්ත්‍රීවරයාට නොවේ චමින්ද මාල් කියන පුද්ගලයාටයි. අද හෙට කරදරයක් වුණොත් අපි මාලිමාව බල බල ඉන්නවාද? චමින්ද මාල් සහෝදරයාට, සභාපතිතුමාට ප්‍රශ්නයක් වුණොත් අපි එතන ඉන්නවා. ඒ නිසා ඔබ තමුන්නාන්සේලාට යුතුකමක් තිබ්බා අපිත් එක්ක සහයෝගයෙන් වැඩ කරන්න. අඩුම තරමේ අපි ඉල්ලුවේ ලයිට් එක විතරයි. ඔබතුමා ලයිට් එක සවිකරලා දුන්නේ තව එක් කෙනෙක් ගෙන්නලා. අපි යන් නැහැ ලයිට් එක සවි කරන කල් කණුව ගාව ඉදන් ඉන්න. අපි යවලා ඒ වැඩේ කරනවා. විපක්ෂයේ හිටිය හැම කාරණාවකදීම ඔබතුමන්ලා ගත්ත තීන්දුවකටම පක්ෂයේ ඉදගෙන අපි විරුද්ධව හිටියා. ඒනිසායි මෙතන ඉන්න මේ කණ්ඩායම ආපසු ආවේ. හොරකම් කරාලා නෙවේනේ. අපි වැඩ කරපු මන්ත්‍රීවරු. ඔබතුමන්ලා අපිට අවස්ථාව දෙනවා නම්, සභාපතිතුමත් සමඟ ගිහිල්ලා ඒ කටයුත්ත අපි කරනවා, එතකොට ඔබතුමාටත් ලකුණක් වැටෙනවා. අපි ඒකට එකඟයි. අශෝක මන්ත්‍රීතුමා ගෙන්වන්න එතුමා එක්කත් අපිට වැඩ කරන්න පුළුවන්. එහෙම එකක් නැහැ. අද රටට වෙලා තියන ප්‍රශ්න බලන්න. මුහුණ පොතේ බලන්න හැම තැනම චෝදනාවල් තියෙන්නේ මේ ප්‍රශ්න ටික නිසා. ඔබතුමාට මම උපදෙස් දෙන්න යන් නැහැ. නමුත් සහයෝගයෙන් වැඩ කරන්න මේ ක්‍රමය කවදාවත් හරි යන් නැහැ. මම නම් ශබ්ද නැතුව ඉන්නවා. මගේ කොට්ඨාසයේ ඕන තරම් වැඩ කරන්න මගේ ගේ ළඟ හරි කොන්ක්‍රීට් කරත් මම නම් සභාපතිතුමා එළියට බහින් නැහැ. මට කරන්න පුළුවන් දේ මම කරනවා. උදාහරණයක් ගත්තහම, අවුරුදු 76ක දේශපාලන ඉතිහාසයේ කාටද හොඳ කියන්නේ ඩී.එස්.සේනානායක මහතාටයි, ඩඩ්ලි සේනානායක මහතාටයි විතරයි ජේ.ආර්ගෙන් පස්සේ ගත්තහම අනිත් ඔක්කෝම හොරු කියලා කියනවා. විජේවීර සහෝදරයා ගත්තාහම වෙන කතාවක් කියන්නේ .එතකොට චන්ද්‍රිකා බණ්ඩාර මැතිනිය 2/3 ක කටත් වැඩිය ආණ්ඩුවක් තියාගෙන වුණ දේ. මම කියන්නේ දේශපාලනයේදී අවුරුදු හතරෙන් පහෙන් පස්සේ ඔබතුමා පයින් පාගන පාපිස්සක තරම්වත් ගනන් ගන් නැහැ. මටත් එහෙමයි. ඉතින් මේකටද අපි රණ්ඩු වෙන්නේ.

ලෙඩදුක් තියාගෙන පීඩනයක් දරාගෙන ඔබතුමත් එක්ක මන්ත්‍රීවරුත් එක්ක රණ්ඩු වෙලා මොකටද කරන්නේ. අපේ වැඩක් කරන් ඉන්නවා. හැබැයි ඇඹූල, මරණ ඕන දෙයකට ගමේ මනුස්සයකුගේ කරදරයකදී අපි පාරට බහිනවා ඒක නවත්වන්න බැහැ. සභාවට ජාතික ජන බලවේගයට, ගමේ විරුද්ධ පක්ෂයකට, පොහොට්ටුවේ කෙනෙක්ටවත් නවත්වන්නත් බැහැ කිසිම කෙනෙකුට නවත්වන්න බැහැ. හැබැයි තේරුම් ගත යුත්තේ, අපි දුර දැකලා තියෙන්නේ. ගාමිණි ගුණදාස මහතා හිටියා කොපමණ සේවයක් කරපු මනුස්සයෙක්ද ඔහේ මැරිලා ගියා. සන්ධ්‍යා කුමාර මහතා මැරිලා ගියා අද එතකොට රත්නායක මහත්තයා ගෙදරට වෙලා වැඩ කරනවා. ඒක තමා දේශපාලනයේ ස්වභාවය. මේ අවුරුදු හතර ඉන්නකල් අපි තමා පොරවල් කියලා ඉන්නවා. ස්වාධීනව අපි ඉල්ලුවාම අපිට ඡන්දය දුන්නේ ඇයි අපි මිනිස්සු එක්ක හිටපු නිසා. තේරුම් ගන්න ඔබතුමා. ගමේ කුඩුමුල්ල හන්දියේ තියන පෙට්ටි කඩේ. පෙට්ටි කඩේ දුන්නේ කවුද? 2018 මාත් එක්ක සමගි ජන බලවේගයෙන් තරග කරපු නිලමේ අයියගේ නෝනා. සමෘද්ධියේ එකට හිටියේ පෙට්ටි කඩේ ජාතික බලවේගයෙන් මාත් එක්ක හිටපු කෙනා. දෙවනියට හිටියේ කඩේ ධර්මේ අයියා. තුනට හිටියේ ඉද්දමල්ගොඩ. හැබැයි දෙකම අයින් කරලා ජාතික ජන බලවේගයේ කෙනාට මම සමාද්ධිය තෝරලා දුන්නේ. ඒක තමා දේශපාලනය. ඔබතුමන්ලා දුන්නු මෙලෝ දෙයක් නැහැ.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු මන්ත්‍රිතුමනි, ඔබ තුමා දන්නේ ඔය ටික විතරනේ. මම මේ සැරේ නිවස හදලා තියෙන්නේ සමගි ජන බලවේගයේ ඡන්ද පොළ නියෝජිතයෙකු ලෙස හිටපු කෙනාට තමා ලක්ෂ 10 දීලා ගේ හදලා තියෙන්නේ.මම කියන්නම් ලිස්ට් එක්ම මම කතා කරන් නැහැ ඉතින්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මේවා කතා කරන්නේ අපි ඔබතුමන්ලා සේරම එකට ඉන්න මිනිස්සු නිසා . මට අවශ්‍ය නැහැ දේශපාලනයේදී කාත් එක්කවත් ඇණ කොටා ගන්න. මම කියන්නේ මොනවාහරි කාරණාවක් නිසා මෙතෙන්ට අපිව තෝරලා එවලා තියනවා. ප්‍රජාතන්ත්‍රවාදීව ඒ කටයුත්ත කරන්න ඕනි. ඔබතුමාට ප්‍රතිපාදන පසුගිය ආණ්ඩුවලින් ලැබුන් නැහැ කියලා. තේ වත්ත පාරේ ලක්ෂයක් අරන් ඔබතුමා ව්‍යාපෘතියක් කරනවා පසුගිය ආණ්ඩුවලදී අඩි 20ක එකක් 30ක්ද 40ක්ද කරනවා. ඒ ලක්ෂයෙන්ම මමත් අඩි 156 ක් කරනවා කුඩුම්ල්ලේ ඇවිල්ලා බලන්න. අපිට මේවා එකතු වෙලා කරන්න පුළුවන්. අපිට මෝටර් ග්‍රේඩරය දෙනවා නම්, දේශපාලන කාරණා වෙනම කාරණා. ඔබතුමා සම්බන්ධව වෙලා කරන්න පුළුවන් නම් හොඳයි. මම දන් නැහැ පක්ෂයෙන් යම් කාරණා තියනවාද කියලා. ඉතින් අපි කිසිසේත්ම අග්බෝවේ හිටපු නලීන් මන්ත්‍රීතුමා වෙනුවෙන් කතාකරන් නැහැ ගරු සභාපතිතුමා. ඒ නිසා ඔබතුමා තීන්දුවක් ගන්නවා නම්, හරියටම මේ කරුණු කාරණා සත්‍ය යැයි කියලා අපි සියලු දෙනාම ඒ කටයුත්තට සහයෝගය ලබා දෙනවා. ඒ නිසා මට නම් කිසිම දෙයක් එපා. බලහත්කාරයෙන් කිසිම දෙයක් ගන්න යන්නෙත් නැහැ. ඒ නිසා මේ අවුරුදු හතරත් ඉඳලා මාලිමාවට විරුද්ධව යන්නෙත් නැහැ. අපේ පාඩුවේ අපි වැඩක් බලාගෙන ඉන්නවා. මෙතනදී අපි කමිටුවක් රැස්වීමක් ඉල්ලුවා දුන් නැහැනේ. දෙන්නැත් නම් දෙන් නැහැ එතනින් එහාට කතා කරාට වැඩක් නැහැ. ලයිට් එක සවි කරන්න ගත්තහම ඒක දෙන්නැත්නම්, තව කෙනෙක් එවනවා පස්සෙන් ඒකට අපි පොරබදන්න යන්න ඕනි නැහැ. ඒ නිසා ඒකත් අතැරියා. ගමේ මොනවාහරි සමිතියකින් සමාගමකින් මොනවා හරි ඉල්ලීමක් කරොත්, ඒ ටික කරලා දෙන්න. එතකල් කිසිම කෙනෙක් කෙරෙහි අපිට වෛරයක් කිසිම ප්‍රශ්නයක් නැහැ. මම මේ ප්‍රකාශය කරන්නේ කලකිරීමකින් වැඩක් නැහැ. ඒ කරුණු කාරණා සමහ එහෙයි කියලා ඔළුව නමලා වැඩකුත් නැහැ. කොන්දක් ඇතුව ජීවත් වන මිනිස්සු විදිහට මාලිමා ආණ්ඩුවට ජය වේවා කියලා නතර වෙනවා. සුබිත මුදිත රටක් හදනවා නම්, පොහොසත් රටක් හදනවා නම්, කකුළෙන් නම් අදින් නැහැ. ඒක තමා සත්‍ය සහයෝගයක් ඉල්ලන්න ඔබතුමා නිසා ඒ උදව්ව අපි කරනවා.

මම අතින් යම්කිසි වැරැද්දක් වුණා නම් අනවශ්‍ය දෙයක් කතා කරා නම් සමාව භාජනය කරන්න කියලා ඉල්ලා සිටිනවා බොහෝම ස්තූතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මෙම කාරණා කිහිපය සම්බන්ධව අදහස් දක්වන්න සිදු වෙනවා. පොල සම්බන්ධව සිදු කළ සාකච්ඡාවේදී අතුකෝරාල මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ කාරණා සම්බන්ධයෙන් එකඟයි. මේකේ මූලික වගකීම තියෙන්නේ මොහාන් මන්ත්‍රීතුමාලටයි. ඒගොල්ලෝ තමා මේකේ වැරැද්ද කළේ. මේ තත්වයට පොල ඇති කරන්න කටයුතු කළේ එතුමායි.

ඒවගේම සභාපතිතුමා ඔබතුමා උඩින් පල්ලෙන් කරන්න ගිහාම ඉදිරි කාලයේ මේකට ලොකු ප්‍රශ්නයක් එනවා. නමුත් ඔබතුමා තනි මතයට වැඩ කරනවා නම්, ගැටලුවක් නැහැ කරගෙන යන්න. අපි ඉල්ලුවේ සාකච්ඡාවක් කරලා මේ ඉදි කිරීම කරන්න කියලා. සාකච්ඡාවක් කරලා සියලු දෙනාගේම අනුමැතිය සමඟ වෙනස්කළ යුත්තක් වෙනස් කරලා ඒක පැහැදිලිව කරන්න කියලා. ඒක පැහැදිලිව ඔබතුමාට කරන්න හැකියාවක් නැත්නම් ඒක ඔබතුමාට කරගෙන යන්න පුළුවන් නම් ඒක කරගෙන යන්න කිසි ගැටලුවක් නැහැ. දෙවනි කාරණය තමා ගරු සභාපතිතුමනි, අපි ගරු මන්ත්‍රීවරු 12 දෙනෙක් අත්සන් කරලා යම්කිසි යෝජනාවක් ඔබතුමාට දෙනකොට ඔබතුමා ඒක කුණු මාළු කැල්ලක් වගේ විසික් කරන්න බැහැ. අතුකෝරාල මන්ත්‍රීතුමාගේ යෝජනාවක් දුන්නා ඒක විසික් කරා. අද නාරද මන්ත්‍රීතුමාගේ යෝජනාවක් ගෙනාවා ඔබතුමා විසික් කරා. ජනතාව මන්ත්‍රීවරු විදිහට පත් කිරීමෙන් ඔවුන්ගේ කාරණා ඉටු වෙන් නැහැ. ඔබතුමා ඒවා යෝජනාවක් විදිහට ඉදිරිපත් කරලා ඒක භාර ගන්න. ඔබතුමා කියනවා උදේට ගෙනත් දෙනවා කියලා එහෙනම් ඔබතුමා උදේට ඕනි තරම් යෝජනා දාලා තියනවා. එතකොට අපි යෝජනාවට සහයෝගය දෙනවා. සමහර විට මේ මන්ත්‍රීවරු දන්නෙත් නැහැ ඔබතුමා දාන යෝජනාව මොනවාද කියලා. නමුත් මේවා සභාවට අත්‍යාවශ්‍ය යෝජනා නිසා, අපි සහයෝගය දෙන්නේ. සභාපතිවරයාට අවශ්‍ය බල ප්‍රදේශයට අවශ්‍ය යෝජනා නිසයි. ඒවගේම තමා මෙම යෝජනාත්. අපි මේවා ඉදිරිපත් කරන්නේ ගරු මන්ත්‍රීවරුන්ගේ, මෙම කණ්ඩායමේ අවශ්‍යතාවය නිසායි. මෙම යෝජනා ඉදිරිපත් කරා නම් ඒ පිළිබඳව කතා කරා, ඒක ප්‍රතික්ෂේප කරා නම් ප්‍රතික්ෂේප කරා ඡන්දයක් අවශ්‍ය නම් ඡන්දයක් තියනවා. ඒ පිළිබඳව ඉදිරිපත් කරන්න ඔබතුමාට හැකියාවක් තියෙන්න ඕනි. ඒනිසා හැමදේකටම බයේ ඔබතුමා වහලා කටයුතු කරන්න හදනවා නම් මම ඔබතුමා ගැන කණගාටු වෙනවා. ඒවගේම ගරු සභාපතිතුමනි, සභාවට එවන ලිපි ඉදිරිපත් වෙන් නැහැ. මේක එක්තරා කාරණයක් මෙම ලිපියත් ජනාධිපතිතුමා හරහා ගිය ලියුමක් අපිට පිටපතක් එවලා තියනවා. ඔබතුමාට ආවද නැද්ද දන් නැහැ. තව ලිපියක් තියනවා මාළු කඩයක් සම්බන්ධව ලියාපදිංචි තැපෑලෙන් ඇවිල්ලා තියනවා. මේකත් එවලා තියෙන්නේ සභාපතිතුමාට. මේ ප්‍රදේශයේ අවශ්‍යතාවයක් සම්බන්ධයෙන් මාළු ලැල්ලක් ඉල්ලලා තියනවා ඒ.එල්.එල්.නිමාෂි, නො.605, නාරම්මල පාර, අලව්ව. එතකොට මේක හොඳ හෝ නරක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට ගැලපෙනවාද නැද්ද අපේ ආයතන ව්‍යුහයට අඩංගුද නැද්ද මේවා සාකච්ඡා කරන්න ඕනි. සාකච්ඡා කරලා තීරණයක් ගන්න මේවා ඕනිද එපාද කියලා. මේකේ ව්‍යාපෘති වාර්තාවක් ඇවිත් තියනවා. මේ අලව්ව ප්‍රාදේශීය සභාවට විශේෂ නැති වෙන්න පුළුවන්. අද වෙනකොට මෙම පුද්ගලයා කළුද සුදු ද හොරෙක්ද කුඩු කාරයෙක්ද අපිට වැදගත් නැහැ. හැබැයි මේක අලව්ව ප්‍රාදේශීය සභාවට මේවාගේ යෝජනා වැදගත් වෙන්න පුළුවන්. නිරෝෂා කියලා අද මාළු සමාගමක් තියනවා කුරුණෑගල, නිට්ටඹුව වැනි ප්‍රදේශවල තියනවා අද වන විට මිනිස්සුන්ට අඩුවට හොඳ මාළු කැල්ලක් ගන්න හොඳ අවස්ථාවක් උදා වෙනවා. මේක හොඳ නැද්ද නරකද කියන්න දන් නැහැ. අපි මේවා සාකච්ඡා කළ යුතුයි. එහෙම නැතුව ලියුමක් ආපුවහම ඒක හංගලා ඔබතුමා අවශ්‍ය යෝජනා විතරක් දාලා කරගෙන යනවා නම් අපි සභාවට එන එකේ තේරුමක් නැහැ. ඔබතුමා යෝජනා කරන්න විපක්ෂය එන්න එපා නම් අපි නවතින්නම්. ගැටලුවක් නැහැ.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමා, දැන් මේ ගරු සභාව ඔය මාළු කඩ සම්බන්ධව ගත්ත තීන්දුවක් තියනවා. ඔබතුමා ඒක දන් නැත්තේ නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මම දන්නවා, ඒත් මේක අලුත් යෝජනාවක්.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු මන්ත්‍රීවරුනි, ඒ මනුස්සයාම තමා මාළු කඩ ටික අරගෙන තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**

ගරු සභාපතිතුමනි, වෙන්න පුළුවන්.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු මන්ත්‍රීවරුනි, එදා ඉඳලා අලව්ව ප්‍රාදේශීය සභාවට තිබ්බ මාළු කඩ ටිකෙන් සභාවට ආදායම් ගෙනාපු එක කාට හරි පෞද්ගලිකව ගොඩ නැගෙන්න ඉඩ දෙන්න කියලාද කියන්නේ. ඒ හින්දානේ අපි සභාව ඇතුළේ තීරණයක් ගත්තේ මාළු කඩ ටික සභා ගොඩනැගිල්ලට ගේන්න ඕනි කියලා.

පෞද්ගලිකව කෙනෙකුට කිලෝමීටර් එක හමාරක් මෙපිට මාළුකඩ දාන්න බැහැ කියලා මේ ගරු සභාවේ තීන්දුවක් ගත්තා. ඒ තීන්දුවට අනුකූලව තමා ඒකට ඉඩ දෙන් නැත්තේ. අපි කතා කරමු. ඒක වෙනයි. ඔය කරන චෝදනාව නෙවේ අපි සාමූහිකව සභාවෙන් ගත්ත තීන්දුව අනුව තමා ක්‍රියාත්මක වෙන්නේ. එයා කරන්න හදන වැඩේ ගැන අවබෝධයක් තියනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ඔබතුමා කියනවා මේ මාළු කඩ සේරම මිනිහා අරගෙනලු. ඒ මිනිහා නම් අරන් තියෙන්නේ එයත් එක්ක අපි කතා කරන්න ඕනිනේ. සභාව ඒ ගැන කතා කරන්න ඕනි. ඔබතුමානේ කතා කරලා තියෙන්නේ. සභාවේ අපි කතා කරලා නැහැනේ.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු මන්ත්‍රීවරුනි, පටහැනි එකක් නොවෙන්න ඉතින් සභාවේ කතා කරලානේ තීන්දුවක් අරන් තියෙන්නේ. ඔය පටහැනි එකක් එන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**

ගරු සභාපතිතුමනි, අපි මාළු කඩය දානවාද නැද්ද දන් නැහැ. ලියාපදිංචි තැපැලෙන් ඔබතුමාට ආපු ලිපියක් අපිට එනවා ඒත් ඒවා කතා කරන්න සභාවට යොමු වෙන් නැහැ. අපි ඒවා කතාකරන්න ඕනි. නැත්නම් මේ සභාවේ වැඩක් නැහැනේ. අතුකෝරාල මන්ත්‍රීතුමා කීව වගේ ස්ටෙපර් එකක් ගහලා මටත් ගෙදර ඉන්න වෙන්නේ සභාවට එන එක වැඩක් නැහැනේ. ඇත්තටම ඔබතුමාගේ නීතිය දන් නැහැ අද මාධ්‍යවේදියෙක්වත් නැහැ. ඒ කට්ටියටත් එන්න එපා කියනවාද දන් නැහැ. එහෙම නීතිද දන් නැහැ යන්නේ. අපිට අදාල නැහැ. හැබැයි ඔබතුමාටත් සදාකල් බලයේ ඉන්න බැහැ අපිට ඉන්නත් බැහැ.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමා, ඒක හොඳට අවබෝධ කරගෙන ඉන්න සභාපතිවරයෙක් මම. අදත් මම මහ පොළොවේ බැහැලා ඉන්න කෙනෙක්. මම හිටපු සභාපතිවරු හිටිය විදිහත් දන්නවා මම ඉන්න ඕනි විදිහත් දන්නවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ඒක හරි ඒත් මම දකිනවිදිහට ඔබතුමාට වැඩිය මම මහ පොළොවේ ඉන්නවා. අපිත් පොලට ගිහින් බඩු ටික අරගෙන බෑග් එක එල්ලන් පයින් එන මිනිස්සු .ඒ නිසා මේ තත්වයෙන් මිදිලා ඔබතුමා කටයුතු කරන්න. අද තරම් මේ දේවල් පහලට ගිය කාලයක් නැහැ. අද වන විට ග්‍රාම සංවර්ධන කමිටුව ගන්නත් බලපෑම් කරනවා. මරණාධාර සමිතිය ගන්නත් බලපෑමක් කරනවා. සිවිල් ආරක්ෂක කමිටුව ගන්නත් බලපෑම් කරනවා. එහෙම කාලයක් මම කවදාවත් දැකලා නැහැ. ඒ තත්වයට ඔබතුමා එන්න එපා. මට පේනනේ එතෙන්ට ඔබතුමා කටයුතු කරගෙන යන්නේ කියලා. එහෙම කරගෙන යනවා නම්, කරගෙන යන්න ගැටලුවක් නැහැ. අතුකොරාල මන්ත්‍රීතුමා කීවා වගේ අපිට පක්ෂයක් නැහැ අපි ස්වාධීනව ඉන්නේ. හැබැයි පක්ෂයක් නැති උනාට අපිට ඇත්ත තේරෙනවා. මහ පොළොවේ පය ගහලා ඉන්න නිසා. ඒ නිසා මේ පිළිබඳව ඔබතුමා තීරණයක් ගන්න. කැමති විදිහකට කරගෙන යන්න මින් ඉදිරියටත් මෙහෙම වෙනවා නම්, මේ සභාවේ ඉදිරියට කටයුතු කරන නොකරන එක ගැන මාත් තීරණයක් ගන්නවා කියලා ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජේ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මෙහිදී විශේෂයෙන්ම කාරණා කිහිපයක්ම මතු වුණා. ඔබතුමාට මීට වඩා වගකීමක් ඇතිව වැලිගම සභාපතිතුමාගේ ඝාතනය සම්බන්ධව ශෝකය ප්‍රකාශ කරන්න අවස්ථාවක් දෙන්න තිබුණා. 1991 දී ප්‍රාදේශීය සභා ස්ථාපිත කරනකොට ගාමිණී ගුණදාස හිටපු සභාපතිතුමාගේ කාලයේ පළවෙනි සාකච්ඡාවේදී අද වගේ මතකයි යූ.බී. විජේකෝන් මැතිතුමා කීවා පළාත් පාලන ආයතන ලංකාව පුරාම තුන්සියයකට එහා පිහිටුවනවා.

මේ හැම පළාත් පාලන ආයතනයකම ක්‍රියාදාමය එකයි. යම්කිසි සිදුවීමකදී තමන්ට උනා කියලා හැඟීමකින් කටයුතු කරන්න ඕනි කියලා. මට මතකයි එතුමා ඉල්ලීමක් කරා මහසභා රැස්වීම් දවසක මෙම්බර්ලා මගේ මේස උඩින් උදේට ලිපි තියනවා මම මොකද කරන්නේ විජේකොන් ඇමතිතුමා රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන ස්වදේශක කටයතු මීට කලින් මෙහේ හිටපු ඩී.ආර්.ඕ.ගෙන්. එතුමා කීවා හදිසි අවස්ථාවක් මත ගම් වැසියෙක් ඉල්ලීමක් කරාම මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නැත්නම් සභාවට ඒක යොමු කරලා තීරණයක් ගන්න ඒක තමා වඩා ජන සම්මතවාදී හොඳ ක්‍රමය කියලා.

ගාමිණී මහතා දැඩි තීරණ ගත්ත සභාපතිවරයෙක් ලෙස ප්‍රසිද්ධ වුණත් මම දැක්කා බොහොම නම්‍යශීලීව ඒ කටයුත්ත කරා. 2006 මම සභාවට ගියේ. සුමිත් කුමාර රාජපක්ෂ සභාපතිතුමත් එක්ක කටයුතු කළේ. ඔහුත් මේක ප්‍රතික්ෂේප කරේ නැහැ. අශෝක මන්ත්‍රීතුමයි, කපිල මන්ත්‍රීතුමයි නාරම්මල සභාවේ හිටියා එතුමාලත් මේ ක්‍රමය දැක්කා . වැලිගම සභාවේ සභාපතිවරයා සභා ගර්භයේ ඉද්දී සභාවට ඇවිත් වෙඩි තියලා ඝාතනය කරාම සුදු කොඩි දාන එක බැනර් එකක් දාන එක මහජන නියෝජිතයෙක් හැටියට එම ධූරයට ගරු කිරීමක් වශයෙන් කරන දෙයක්. ඒවගේම ඔහු මිය ගිහින් අවසන්. සිය බිරිඳට ස්වාමි පුරුෂයෙක් දරුවන්ට හොඳ පියෙක් අහිමි වුණා. මේ අවස්ථාවේ වැලිගම සභාවේ සභාපතිවරයා ගැන ඇත්තෙන්ම සොයා බැලුවහම මට මතකයි 2006 ප්‍රාදේශීය සභාවේ අපිට පුහුණු වැඩමුළුවක් වැලිගමෙන් ලැබුණා. කැලි කසල ප්‍රතිචක්‍රීකරණය කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම යටතේ අංක එකට තේරිලා හිටියේ වැලිගම සභාව අපි එවෙලේ ගිහාම හිටිය වැලිගම සභාපතිවරයාට නඩු දෙක තුනක් තිබ්බ කෙනෙක්. එයා කීවා හැබැයි ප්‍රදේශය පුරාම පක්ෂ බේදයකින් තොරව පිළිගත් පුද්ගලයෙක්, තීන්දු ගන්නකොට මිනිස්සු වෙනුවෙන් දැඩි තීන්දු ගත්ත චරිතයක් මෙතුමා ඇවිල්ලා මාස කිහිපයයි බොහෝම ප්‍රියමනාප පුද්ගලයෙක් ආපු කාලපරාසය තුළ අපි දැක්කා ජනතාවට කරන ප්‍රකාශ දිහා බැලුවාහම හැම පක්ෂයක් එක්කම බොහොම සුහදව ඉදලා සභාපතිවරයෙක් හැටියට තමන්ගේ වගකීම රාජ්‍ය නිලධාරීන් සමඟ එකතු වෙලා කරද්දී තමා ඔහුගේ ජීවිතය උදුර ගන්නේ. මේ අවස්ථාවේ ගරු සභාපතිතුමනි, මහජන නියෝජිතයෙක් හැටියට ජීවිතයේ ඉදිරියේ සාංගීක දේපලක් හා සමානව ප්‍රාදේශීය සභාව රැක ගනිමින් ජනතාව වෙනුවෙන් යම්කිසි මෙහෙවරක් කරන්න ආපු ඔහුට ඔහුගේ ජීවිතය අහිමි වුණ එක පමණක් නොවේ ආදරණීය බිරිඳට ස්වාමිපුරුෂයෙක් දරුවන්ට හොඳ පියෙක් අහිමි වුණා. මේ අවස්ථාවේ පළමුව අපේ ශෝකය ප්‍රකාශ කරනවා. ඊළඟට ගරු සභාපතිතුමනි, සමන්ත යත්තල්ගොඩ මන්ත්‍රීතුමා විශේෂයෙන් කීවා මොහාන්ලා මේ පොළ සම්බන්ධව වගකියන්න ඕනි කියලා. 2018 අවුරුද්දේ යූ ඩී ඩික්ක්ලෙයා කරලා අලව්ව ප්‍රාදේශීය සභාව ඉල්ලීමක් කරා අලව්වට ඇවිල්ලා ඔබතුමාලායි සභාවයි එකතු වෙලා කරන ගණුදෙනුවට අමතරව ඔබතුමාලත් ඇවිල්ලා දැන් මේ ගොඩනැගිලි අයඳුම්පත්‍රයක් අනුමත කරන තැන ඉදලා සියලු කටයුතුවලට සම්බන්ධ වෙනවා ඔබතුමාගේ ගාස්තුව ගෙවන්න කියනවා. ඔබතුමාලත් අපේ බල ප්‍රදේශයේ මනුස්සයෙක් හදන ගෙයක හෝ අනිත් කටයුත්තක වේවා ඔබතුමාලගේ කොටසත් නාගරික සංවර්ධන අධිකාරියට ගන්නවා. නාගරික සංවර්ධන අධිකාරිය යටත් වෙන්න කලින් මේ සියල්ලේ ආදායමක් ආවා නම් අවේ සභාවටයි. ඒ කාලයේ සභාවේ හිටපු නිලධාරීන් හැම වෙලාවේම ඉල්ලුවා අධිකාරියේ නිලධාරීන්ගෙන් මෙහේ ඉදලා අපෙන් මොනවා හරි අරන් යන එකේ අපිටත් මොනවා හරි ආදායම් මාර්ගයක් වැඩි කරලා දෙන්න කියලා ඉල්ලා සිටියා. එහෙම තියන වකවානුවක තමා රන්කෙත් උයනේ පදිංචි වෙලා ඉන්න නිශ්ශංක මැතිතුමාගේ සහ නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂක ජනරාල් වශයෙන් කටයුතු කරලා විශ්‍රාම ගිය ගල්වාරම මහින්ද මැතිතුමාගේත් සහාය ලැබිලා සතිපොල ප්‍රදාන වගයක් ඇවිල්ල තියනවා ඒක ගත්ත හැකි ඩිසයින් එක ඔක්කෝම කරලා දෙන්නම් මේක ඇමතිතුමාට කතා කරන්න පුළුවන්ද කියලා. පාඨලි චම්පික ඇමතිතුමාට කතා කරාම එතුමා සතිපොල ප්‍රධානයක් අලව්වට දෙන්නම්. සාකච්ඡා කරලා ක්‍රියාත්මක කරගන්න කියලා. සතිපොල ප්‍රදානය ලක්ෂ 1600ක් ගෙනාවා. මම එදා දැක්කේ නාරම්මලත් මේ වගේම සතිපොලක් නවීකරණය කරන්න කියලා යෝජනාව ආවහම එදා ජනතා විමුක්ති පෙරමුණේ මහජන නියෝජිතයෝ දෙන්නම විරුද්ධ වුණා. අපි ඇහුවාම පක්ෂයේ ප්‍රතිපත්ති අනුව විරුද්ධ වෙන්න සිදුවෙනවා කීවා. එදා පක්ෂ විපක්ෂ අපි ඔක්කෝම එකට එකතු වෙලා අපි කීවා සතිපොල ක්‍රියාත්මක කරන්න කලින් ව්‍යාපාරික ප්‍රජාව කැඳවන්න සහ නාරම්මල නගරයත් එක්ක සතිපොලත් එක්ක ගණුදෙනු කරන විශාල පාරිභෝගික ජනතාවක් ඉන්නවා ඒ පාරිභෝගික ජනතාව නියෝජනය වෙන්න ඒ සමිති සමාගම්වලින් කීපදෙනෙකුත් කැඳවලා සාකච්ඡාවකට යන්න ඒකට නාගරික සංවර්ධන අධිකාරිය මේ ව්‍යාපෘතිය භාරව කටයුතු කරන කණ්ඩායමත් ගෙන්නන්න කියලා. බෝඩ් එකට දාලා සතිපොල පිළිබඳව සම්පූර්ණ විස්තරයක් කරා. සාකච්ඡා වට කීපයක් පැවතුණා. නාරම්මල පොලේ ව්‍යාපාරික මහත්වරුන්ගේ සහ පාරිභෝගික මහතුන්ගේ අදහස් ටිකත් ඒකට ගොනු කරලා අවසානයේ සතිපොල හදන යෝජනාවට ගරු සභාවට ඉදිරිපත් කරාම මම ඒ යෝජනාව ස්ථිර කරා. නාරම්මල සතිපොල කෙරුණා යම් යම් චෝදනා තිබුණා. අවසානයේ එදා නාරම්මල සතිපොල බෙදනකොටත්, ඒ කිසිම අවස්ථාවක අපි ඒකට අත ගැහුවේ නැහැ. නාරම්මල සතිපොල භූමිය තුළ ව්‍යාපාර කටයුතුවල නියැලුණ ඒ ප්‍රජාවගේ ලැයිස්තුව සභාවට ගෙනාවා නම්, ඒ ලැයිස්තුවේ නම් ප්‍රකාරව සභාවේ ෆයිල් එකක් තියනවා නම්,

ඒ නම් ප්‍රකාරව බෙදනවා මිසක් දේශපාලන අධිකාරය කියලා උඩින් ගිහින් දාන්න එපා එතකොට ප්‍රශ්න පත්‍රයක් වෙනවා කියලා කීවා. ඊට පස්සේ අපිත් රැස්වීමක් තියන්න උවමනා වුණාම නාරම්මල සතිපොළේ ගත්තේ. විශාල වහලයක් විශාල ජනකායක් එකට රැස්වුණ ස්ථානයක් බවට පක්ෂ විපක්ෂ බේදයකින් තොරව අපි කාටත් ප්‍රයෝජනයක් ගන්න පුළුවන් වුණා. එවැනිම සතිපොලක් තමා අපි අලවව්වට නිර්මාණය කරලා ගෙනාවේ. එවේලාවේ අතුකෝරාල මන්ත්‍රීතුමාලත් විරුද්ධ වුණා. මේක ගේන්න මම ලොකු කැපකිරීමක් කරා. විශේෂයෙන්ම සන්ධ්‍යා කුමාර හිටපු සභාපතිතුමා මිය ගියත් ඔහුට ගරු කරනවා. ඔහු දුරකථන ඇමතුමක් දීලා කීවා මල්ලියේ මේකට පොඩි ප්‍රශ්නයක් තියනවා කියලා මම කීවා නැහැ මුදලාලි මහත්වරු ඔක්කෝම කැඳවලා සාකච්ඡාවක් තියන්න එගොල්ලන්ගේ අදහස් ඔක්කොම ගන්න කියලා ඒ තුළින් වඩාත් යහපත් වඩාත් නිවැරදි සුදුසු තීරණයකට යන්න කියලා. මන්ත්‍රී මණ්ඩලය කැඳෙව්වා ගරු සභාපතිතුමනි මේවා දෛවයේ සරදමක් වගේ ඔබතුමයි කරවල විකුණන මහතායි සියල්ල එකතු වෙලා සම්පූර්ණ මේ සතිපොල හදන එකට විරුද්ධ වුණා. විරුද්ධ වෙලා නමුත් සතිපොල ප්‍රදානයන් අහක යන එක අපරාදයක් කියන තැන සභාපතිතුමා හිටපු නිසා ඒවෙලාවේ දේශපාලනය පිළිබඳ කිසිම අවබෝධයක් නැති රුකාන්ත ගුණතිලක මහත්තයා සතිපොල නිරීක්ෂණය කරන්න ආවා. එවෙලෙහි මම කීවා මුදලාලි මහත්වරු ඇවිල්ලා ඉන්නවා, වාහනයක් පාර්ක් කරගන්න බැරුව එළියේ මිනිස්සු එක්කත් සාකච්ඡා කරන්න පළපුරුදු නැති වැඩකට අත ගහන්න එපා. මේක පුළුවන් මට මේක නගර සංවර්ධනයට ගන්න කියලා කීවා .මම කීවා ප්‍රදානයක්, නගරයේ වෙන කටයුත්තකට යොදවන්න බැහැ කියලා තේරුම් අරගෙන මහජන නියෝජිතයෙක් හැටියට වැඩ කරන කෙනෙක්ගෙන් අහලා මෙතෙන්ට එන්න කියලා. ඒ ඩිසයින් එක නාගරික සංවර්ධන අධිකාරියේ තියනවා. නාරම්මල වගේ විශාල වහලයක්. පාර්කින් එකත් එක්ක එන්න එදා අපි ඉල්ලීම කරලා තිබුණා. සතිපොල ගැන කියන කොට අපේ පරම්පාරවයි ඔබතුමාගේ පරම්පාරවයි මේකට සම්බන්ධ නැහැ. මගේ මුත්තා තමා අලව්ව සිකුරාදා සතිපොලේ භාරකරු. ගාලේවෙලුන් අප්පු හාමු. ඒ නිසා සතිපොලවල් ගැන අමුතුවෙන් කියන්න දෙයක් නැහැ. අපි බැලුවේ හැමෝටම වඩාත් යහපත් සතිපොලක් නිර්මාණය කරගන්න. අපිට ඒකට අවකාශය ලැබුන් නැහැ. එක මට්ටමකට පොළොව උස්සලා. ඒ සතිපොල කරන්න තිබ්බ අවස්ථාව නැති උනා. ඊළඟ සතිපොල තමා මේ ගෙනාව එක . මේක තට්ටු දෙකකට ආවහම අපිට ආව ප්‍රශ්නය තමා උස නැහැ ඔබතුමාත් කතා කරලා කීවා මේකේ කෙසෙල් ඉදවන්න ලේසියි කියලා. අපි කීවා මේක නවත්වන්න කියලා. වැත්තැවේ මැතිනිය සභාපති වෙලා ඉද්දී අපි මේක ගැන කතා කරා. මේක නවත්තලා වහාම කණු උස්සන්න. එහෙම ගිහිල්ලා සතිපොල ඉදි කරලා සතිපොල බෙදද්දී ලේකම්තුමිය මගෙන් දුරකථන ඇමතුමක් දීලා ඇහුවා ඒකට ගරු කරන්න ඕනි එවෙලේ මේකට මහ සභාවේ ගරු මන්ත්‍රී මණ්ඩලය තීරණය ගත්තේ කොහොමද කියලා ඇහුවා. ඔබතුමියගේ කාර්යාලයේ ලේඛනයෙහි ඇති අපි එවලෙහි එක් එක් ව්‍යාපාරිකයාගේ නම් වශයෙන් අරගෙන වීඩියෝ ක්ලිප් එකක් අරගෙන ඒ සියලු වෙළෙන්දුන් වෙළඳාම් කරන ආකාරය පිළිබඳව නිවැරදි දත්ත මත ඒ අයට කඩ කාමර එකද දෙකද දෙන්නේ කියලා තීරණය කළේ කියලා කීවා. ගරු සභාපතිතුමාගේ කතාවෙන්ම තේරුණා. සමහර අය කඩ හත අට අල්ලගෙන පොලේ අය කඩ කාමර අත යට විකුණලා. එතකොට මේ සභාවේ තමුන්නාන්සේලාට හිතෙන්න පුළුවන් අලුත් මහජන නියෝජිතයෝ හැටියට මේ සෙට් එකත් මේකට සම්බන්ධ ඇති කියලා. මම වගකීමෙන් කියනවා. නගරය සම්බන්ධව තීරණ ගත්ත හැම වෙලාවකම මන්ත්‍රී මණ්ඩලය කුමන පක්ෂයක හිටියත් මට කතා කරලා ඇහුවා මේකේ සුදුසු ම පැත්ත මොකක්ද කියලා. ත්‍රීවිල් පාර්ක් එක විකුණනකොට හොර රහසේ ඒකට විරුද්ධ වුණා. අදටත් ඒ වැඩේ කරනවා. නගරය සංවර්ධන කරන්න යෝජනාව ගෙනාවාහම අපේ නගරය සංවර්ධනය කරන්න බැහැ ගරු මන්ත්‍රීවරුනි. ඇයි හේතුව වන්දි ගන්න කටයුතු කරේ නැත්තේ කියලා මේ ළඟදිත් මගෙන් ඇහුවා. වන්දි ගන්න කටයුතු කරා නම්, බහුතරයක් මේ කඩවල අය අවුරුදු 100ක් 250ක් කුලියට ඉන්න කට්ටිය. ඉඩම් හිමියා බලන් හිටියේ කොහොමද එළියට දාගන්නේ කියලා. අවසානයේ පර්චස් එකක් ඉතුරු වුණා. කඩයක් කඩා ගන්න සද්භාවයෙන් සහාය දැක්වුවා නම් ඒ ව්‍යාපාරික මහත්තයා එයාට ඉතුරු වුණ එක පර්චස් එක වුණත්, එයාට එකේ ගොඩනැගිල්ලක් ඉදි කරගන්න සභාවේ අවසරයක් ලබා දෙන්න සුදුසු බවට, මේ ගරු සභාවේ යෝජනාවක් සම්මත කරලා තමුන්නාන්සේත් අත උස්සලා ඒක විෂයභාර ඇමතිට යවලා නාගරික සංවර්ධන අධිකාරියෙන් ගෙනල්ලා තමා අපි නගර සංවර්ධනයට ගියේ. ගරු සභාපතිතුමනි, වෙළඳ සංගමයේ සභාපති පොලේ නලින් මන්ත්‍රීතුමයි, ලේකම්, භාණ්ඩාගාරික කියන එක අපිට අදාල නැත. හැබැයි එතන බහුතරයක් වෙළෙන්දෝ කියනවා නම්, සාධාරණයක් හා යුක්තියක් ඉෂ්ට කළ යුතුයි කියලා ඒ සම්බන්ධයෙන් ගරු සභාවට කැඳවලා ඔබතුමාගේ මන්ත්‍රී මණ්ඩලය කැඳවලා හරි තීරණයක් ගත්තා නම්,

මේක වෙන්න යන්නේ මෙහෙමයි අපි කරන සැලැස්ම මෙච්චරයි තමුන්නාන්සේලාට මේකේ ස්ථාන දීලා තියෙන්නේ එකයි හෝ දෙකයි හැබැයි අද වෙනකොට නම් වශයෙන් ස්ථාන එක්කෙනෙකුට අටක් තියනවා. ඔබතුමා කීව විදිහට චූටි පුතාට, නලීන්ට මන්ත්‍රීතුමාට ඔබතුමාගේ සහෝදරයාට, අනුර අයියට මේවාගේ කණ්ඩායමකට සතිපොලේ වැඩි කඩ කාමර ප්‍රමාණයක් ගිහිල්ලා එහෙම යන්න බැහැ. ඒක නීත්‍යානුකූලත් නැහැ. අතාරින්නත් එපා මන්ත්‍රී මණ්ඩලය විදිහට සහාය දෙනවා නම්, සභාපතිවරයෙක් විදිහට තීරණයක් ගන්න. ඇයි අපි අයවැයට සහාය දුන්නේ ඔබතුමාට. මේ බල ප්‍රදේශයේ හුදු මහත් ජනතාව වෙනුවෙන් ඔවුන්ගේ ප්‍රශ්න වෙනුවෙන් පෙනී සිටින්න අපි ශක්තියක් වෙලා තියනවා. එහෙම නම් මේ පොලේ ප්‍රශ්න ආපුවාහම එකේක මුදලාලි මහත්වරුන් ඕනි විදහට කරන්න ඉඩ දෙන එක නෙවේ ඔබේ වගකීම සියලු මන්ත්‍රී මණ්ඩලය විරුද්ධයි කියන්න පළාත් පාලන කොමසාරිස් විරුද්ධයි ගරු ආණ්ඩුකාරතුමා විරුද්ධයි කියන්න. වගකියන්න වෙන්නේ මටයි කියන්න .එහෙම නැත්නම් මොකද වෙන්නේ කියන්න. ඔබතුමා කියනවා වක්‍ර විදිහට යම් යම් තැන්වල කඩ කාමර දූෂණය වෙලා කියලා ඔබේ ඇඟිල්ල අපිට දිකු නොවුනොත් කා ගාවටද දික් වෙන්නේ සභාව විසුරුවලා තියන කාලෙක නේද කඩ කාමර දෙන්නේ. රාජ්‍ය නිලධාරීන් මතනේද යන්නේ. එතකොට සහෝදර රාජ්‍ය නිලධාරීන් ටික එකතු වෙලා කූට විදිහට එක් කෙනාට එකක් දෙන්න ඕනි තැනට හතරක් දීලා තියනවා අටක් දීලා තියනවා කියලා තමා ගම්‍ය වෙන්නේ. සභාවක සභාපති ගාවට ගරු සභාපතිතුමනි, ලේකම් සහ ඔබයි ගහයි පොත්තයි වගේ එකට ඉදලා තමා මිනිස්සු වෙනුවෙන් සේවය කරන්නේ. නිලධාරීන් අතින් වැරැද්දක් වෙනවා නම් පනතෙන් දීලා තියනවා සභාපතිකමට අමතරව අධිකාරී බලය ඒක කිසිම තැනක නැහැ. ඒක පාවිච්චි කිරීමේ වගකීම ඔබට තියනවා. නිලධාරීන් හැටියට ඔබට තියනවා. වයස 60න් විශ්‍රාම යන්න ඉන්න කණ්ඩායමක්. වැරැද්දක් වෙන්න යනවා නම් කරුණාකරලා සභාපතිතුමාට කතා කරලා ඒක නිවැරදි කරගන්න දැන් හරි බලය පාවිච්චි කරලා. මේ සති පොලේ කඩ කාමර සම්බන්ධව යම්කිසි අක්‍රමිකතාවයක් වෙලා තියනවා නම්, හොර රහසේ කඩ කාමර අරන් තියේනම් අපිත් ව්‍යාපාරකයෝ හැටියට කියන්නේ ඒවා වෙන්න ඉඩ තියන්නත් එපා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමා, ලේකම්තුමිය අජන්තා මිස් ඒ කාලේ හිටියේ නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමනි, කඩකාමර ගන්නකොට ගත්ත ලැයිස්තුව ඇතිනේ. ඒ ලැයිස්තුව ගන්න ඒ ප්‍රශ්නයට උත්තරය එතන තියෙන්නේ. උඩින් වහලය ගහන තැනට එන්න ඒත් කඩ කාමර ටික නිවැරදි කර ගන්නත් සාකච්ඡාවකට එන්න කියන්න. එතකොට ඔබතුමත් නිදොස් කොට නිදහස්. බහුතරයක් අද හිතන් ඉන්නවා ව්‍යාපාරිකයෝ අපි කණ්ඩායම එකට එකතු වෙලා තීරණයක් අරගෙන එයාලාගෙන් අහන් නැතුව කරනවා කියලා. මේක තමා සමාජ ගත වෙන්නේ. මම ඔය වෙළඳ සංගම්වලට භය මිනිහෙක් නෙවේ. වෙළඳ සංගමයේ සභාපති තනතුර අවුරුදු 10ක් කරා. චෝදනාවක් නැහැ තේ එකක්වත් බීවා කියලා. මහජන නියෝජිතයා හැටියට ඔබ තුමාලගේ පක්ෂයේ කෙනෙක් යෝජනාවක් ගේන්න පුළුවන්. ඒ ගෙනාපු යෝජනාව මේ සභාවට ඉදිරිපත් කරා කියලා ඔබතුමාගේ කීර්තියට ගෞරවයට දශමයක හානියක් වෙන් නැහැ. සභාවේ පෞරෂත්වයට දශමයක හානියක් වෙන් නැහැ. සාකච්ඡා කරා සංවාදයට ලක් කරා කැමති නම් අවසානයට බුදුරජාණන් වහන්සේ දේශනා කරා වගේ ලෙච්ඡවී රජ දරුවෝ වගේ අපි මෙතනින් එළියට ගියා. ඒ ඉල්ලීම කරමින් විශේෂයෙන්ම ලේකම්තුමියගේත් වගකීමක් තියනවා මහජන නියෝජිතයෙක් හැටියට ඉල්ලීමක් කරාම ඒ ලිපියක් හදනකොට සභාපතිතුමාව දැනුවත් කරන්න. මෙතෙක් හිටපු හැම සභාවක සභාපතිවරයාට ප්‍රශ්නයක් එනකොට සභාපතිවරයා දැනුවත් කරලා මේ යන ක්‍රමවේදයේ වැරැද්දක් තියනවා කියලා දැනුවත් කරා. සමාජ මාධ්‍ය ජාලා තුළ සංසරණය වුණ සිදුවීමක් මත මේ යෝජනාවක් ඉදිරිපත් කරන්න බැහැ කියලා. අද සමාජ මාධ්‍ය ගන්නකෝ සභාපතිතුමා ඒ මඩ සංස්කෘතිය තුළ ඔබ නැහැ.සමාජ මාධ්‍ය ජාලා තුළ මඩ ගහනවා නම්, ඒක අපේ අඩුපාඩුවක්. ඒ නිසා මෙවැනි ලිපියක් ආයේ ඉදිරිපත් කරනකොට ඒ ගැනත් අවබෝධයෙන් කටයුතු කරන්න කියන ඉල්ලීම කරමින් කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබ සියලු දෙනාටම ස්තූතිය පල කරමින් මම නිහඬ වෙනවා ස්තූතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මම දකින විදිහට ඔබතුමා කතා කරලා කියපු කාරණා සමඟ මේකේ ප්‍රශ්නයක් නැහැ. හැබැයි මෙතන වරදක් තියනවා.

ඔබතුමාගේ තියන කාර්ය බහුලත්වයක් එක්ක, අධික අවිවේකබාවයත් එක්ක හරි මේ කාරණා ටික මන්ත්‍රීවරුන් එක්ක සාකච්ඡා කරලා පැහැදිලි කරා නම් මේ අර්බුදය මෙච්චර දුරට යන් නැහැනේ සභාපතිතුමා. අපි එතෙන්ට ඔබතුමාත් එක්ක හැමදාම නම්‍යශීලියි. මේ ලිපියේ ඉල්ලා තියන කාරණා තුන ගත්තහම පස්වෙනි කාරණය අදාලම නැහැ. අපේ ප්‍රධාන ගොඩනැගිල්ල සම්බන්ධව සමිතියකට අදාල කාරණයක් නෙවේ. ඒක සම්බන්ධව සමිතියකට තීරණය කරන්න බැහැ ඒක තීරණය කරන්නේ මන්ත්‍රී මණ්ඩලය. ඒ නිසා ඒ කාරණය බැහැර කරනවා. ඒගොල්ලෝ එක තැනක කියනවා පාර්කින් සම්බන්ධව ගැටලුවක් කතා කරනවා. ඒත් ඔබතුමා කියනවා තියනවටත් වඩා වැඩි ප්‍රමාණයක් එනවා කියලා. හැබැයි අපේ අරුණ ජයලත් මන්ත්‍රීතුමා කීවා වගේ මන්ත්‍රීන් තුළ ඒ ගැන අවබෝධයක් නැහැ. ඒ නිසා සභාවක් ඇතුළේ නැති ප්‍රශ්නයක් නිර්මාණය වෙනවා. ප්‍රජාතන්ත්‍රවාදයේ උපරිමය කියලා කියන්නේ මොකක්ද අපි ආවේ වැදි කාලේ ඉඳලා නෙවේනේ. ගල් යුගයේ ගල්වලින් ගහගන්න තැනක ඉන්න ඕනිනේ. දුනු ඊතලවලින් විදගන්න කාලේ වෙන්න ඕනිනේ. ඒක තමා ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ සමාජය පරිණාමය වුණා. ඒ පරිණාමය වෙනකොට තමා ඒකේ මූලික ලක්ෂණය තමා ප්‍රජාතන්ත්‍රවාදය ඒ කියන්නේ සාකච්ඡාවෙන් සම්මුතියෙන් අපි කතා කරලා විසඳගන්න එක. මගේ මතයට චමින්ද මාල් මන්ත්‍රීතුමා එකඟ නැහැ කියලා මම කඩුවක් කිනිස්සක් අරගෙන මරා ගන්න ක්‍රමය නෙවේනේ ප්‍රජාතන්ත්‍රවාදය කියලා කියන්නේ. සාකච්ඡා කරලා අපි ඔක්කෝම එක තැනකට එන් නැහැ ඒත් මැද තැනකට ඇවිත් විසඳගන්නවා. ඒක ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් ගෞරවනීයව ඉල්ලන්නේ කාලය නැති වෙන්නත් පුළුවන් අද හරි කමක් නැහැ මේ මන්ත්‍රී මණ්ඩලය එක්ක පොලට ගිහිල්ලා ඒ සම්බන්ධව, ඉදිවෙන ක්‍රමවේදය සම්බන්ධව දැනුවත් කිරීමක් කරන්න කියලා යෝජනාවක් කරනවා. ඊළඟට පොල සම්බන්ධව පොලේ සමහර පරණ අයට නැතිව අලුත් අයට කඩ කාමර හත අට වැටිලා තියනවා කියලා ඔබතුමා කියනවා. ඔව් ඒක ඇත්ත. මමත් දන්නවා අපි ආණ්ඩුව පාලනය කරන කාලයේ අපේ ඇමතිතුමා රාජ්‍ය ඇමතිවරයා ලෙස ඉන්න කාලයේ මම ගාවටත් ඒ කාලයේ ඔය ප්‍රශ්නය ආවා. එක් කෙනෙක් තමා අපේ ගමේ යන්නන් කියලා මුදලාලි, ආයේ බඹරගල ප්‍රදේශයේ කරෝලිස් මුදලාලි කියලා කඩ කාමර පහක් තිබ්බා. අද ඒ මනුස්සයෝ පොලට එන්නේ නැහැ. ගාමිණී සිල්වලා එන්නේ නැහැ. ඒ මිනිස්සුන්ට වෙළඳාමක් වෙන් නැහැ කියලා. කඩ බෙදනකොට ඒ මිනිස්සුන්ට කඩ කාමර දෙකයි හම්බ වෙලා තියෙන්නේ. ඒකත් ගැලපෙන තැන නෙවේ. ඒ වගේම යන්නන් මුදලාලි කියලා පොරමඩල කෙනෙක් හිටියා යන ඕනිම කෙනෙක්ට යන්නම් යන්නම් කියන නිසා යන්නන් මුදලාලි කියන්නේ. ඒ මුදලාලිගේ එක දරුවෙක් අද පොලේ නැහැ. අනාදිමත් කාලයේ ඉඳලා වෙළඳාම් කරපු අය. ඒ මුදලාලිලා දැන් පොලේ නැහැ. ඒ නිසා යම් අක්‍රමිකතාවයක් වෙලා තියනවා. ගරු සභාපතිතුමනි, හැබැයි මම වගකීමෙන් කියන්න ඕනි ඔය පොල බෙදන වෙලාවේ අපේ ප්‍රාදේශීය සභාවේ බලය පිහිටුවලා නැහැ සභාවේ බලය විසුරුවලා තියෙන්නේ. ඒ නිසා මේ පැත්තට ඇගිල්ලක දික් වෙන්න පුළුවන්. සමහර විට මෙතන ඉන්න මන්ත්‍රීතුමන්ලා හිතන්න පුළුවන් මේ මන්ත්‍රී මණ්ඩලය තමා මේක දීලා තියෙන්නේ අපේ හිතවත් අයට දීලා තියෙන්නේ කියලා අද වරදක් වෙලා තියනවා නම්, දැන් තීන්දු ගන්න දැන් එළියට දාන්න. අපි ඒක ඔබතුමාලට කියනවා. අපි එතන නැහැ අපි හොරකම් කරලත් නැහැ අපි පොලේ එක කඩයක්වත් ඉල්ලලාත් නැහැ. අපිට ඕනිත් නැහැ. ඒ නිසා ඔබතුමා අනිවාර්යෙන් තීන්දුව ගන්න. වරදක් වෙලා තියනවා නම් අවුරුද් සීයක් ගිහින් හරි කමක් නැහැ නිවැරදි කරන්න. අසාධාරණයක් වෙලා තියේ නම්, අවුරුදු ගාණක් පොලේ වෙළඳාම් කරපු මිනිස්සුන්ට දෙන්න. අද රස්සාවක් නැතුව ඉන්නවා. ඒ නිසා ඒ පිළිබඳව ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරන්න කියන කාරණය ඉල්ලා සිටින ගමන්ම පහළ බිත්තිවල කපරාදු කිරීමක් සම්බන්ධවත් මේ ලිපියෙන් එවලා තියනවා. සභාවෙන් අපි ඒක කරන්න ඕනි කර්තව්‍යක් ඒ නිසා ඒකට ඔබතුමා ප්‍රතිපාදන වෙන් කරලා ඒ සඳහා කටයුතු කරන්න කියන කාරණාව ඉල්ලා සිටිනවා. ගරු සභාපතිතුමනි, අපි මේ කතා කරේ තුන් දෙනෙක් එවපු ලිපියක් සම්බන්ධව නෙවේ. අපේ ප්‍රාදේශීය සභාවේ හිටපු පරණ මන්ත්‍රීවරයෙක් කියන පදනම තුළ නෙවේ. හැබැයි ප්‍රාදේශීය සභාවට අපිට ලිපියක් ආපුවහම මේ ලිපිය ගරු සභාපතිතුමනි ලේකම්තුමිය අපි මේවා සභාගත කරන්න ඕනි. අපි සාකච්ඡා කරමු. ඔබතුමා විධායක නිලධාරියෙක් අපි කියන හැම එකටම කැමති වෙන්නත් පුළුවන් නොවෙන්නත් පුළුවන්. අපි මැද තැනකට ඇවිත් මේවා කතා කරමු. වැලිගම සභාවේ සභාපතිවරයාගේ ඝාතනය සම්බන්ධව මීට කලින් ඒ වගේ යෝජනා ඇවිත් තියනවා. මේවා මහා ලොකු දේවල් නෙවේනේ සාකච්ඡා කරා තීරණයකට ආවා කතා කරා ඉවර කරා. මෙහෙම දේකුත් තියනවා ගරු සභාපතිතුමනි, මේක වැරදි ආදර්ශයක් විදිහට ගන්න එපා. ඔබතුමා සහ ලේකම්තුමිය ප්‍රතික්ෂේප කරන ඕනිම යෝජනාවක් අපි මේ සභාවට ගන්න ක්‍රමය දන්නවා. විශේෂ මහසභාවක් සහිතව අපිට ඔය යෝජනාව ගන්න පුළුවන්.

හැබැයි එහෙම ගේන් නැත්තේ අපි හැමවෙලේම අජිත් පරණගම කියන පුද්ගලයාට ගරු කරනවා. තව කාරණාවක් කියන්න ඕනි මාලිමාවේ අයත් එක්ක විවාද කරගන්න නවෙේ වැරදි හදා ගන්න කතා කරන්නේ. කාර්ය මණ්ඩල රැස්වීමක් කැඳවපුවාහම අපිට පිටින් තොරතුරු එනවා විරෝධතා දක්වනවා නෙවේ. අපිට තොරතුරක් එනවා මේ බල ප්‍රදේශයේ සම්බන්ධීකරණ තුමා පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා, මන්ත්‍රී තුමන්ලා කාර්ය මණ්ඩල රැස්වීමට සහභාගී වෙනවා කියලා. එහෙම ඉද ගන්න බැහැ ගරු සභාපතිතුමනි. ඔබතුමාට විතරයි ඉඳගන්න පුළුවන්. මේ කිසිම මන්ත්‍රීවරයෙකුට ඉද ගන්න බැහැ. ඒ නිසා අපි ඒවාවත් මේ සභාවේ කතා කරන් නැහැ. එදා මන් හේතුව කීවා ඔබතුමා ඉද ගන්න පුළුවන් ඇයි කියලා ඔබතුමා විධායක ශ්‍රේණියේ නිලධාරියෙක් මහජන ඡන්දය ආපු සභාපතිවරයෙක් විතරක් නෙවේ. මේ ආයතනයේ නිලධාරී යාන්ත්‍රණයේ ප්‍රධානියා. ඒ නිසා පමණයි ඔබතුමාට ඉද ගන්න පුළුවන්. අපිටවත් ඉද ගන්න බැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මා ඉතාම කාරුණිකව ඔබතුමාට කියන්නේ. මේ සියල්ලම අපි නොදැනම ඉන්නවා නෙවේ. මේවාට ගන්න ඕනි ක්‍රියාමාර්ගත් අපි දන්නවා. අවුරුදු 23 ක් මේකේ මන්ත්‍රී ධූරයේ පොල් ගැවේ නැහැ. අදටත් මම රෑ නිදා ගන්නේ එක පැනලා හිටපු ශාන්ත බණ්ඩාර ඇමතිතුමාට හම්බෙන කොමිෂන් සහා වාර්තා කියවන්නේ එතුමා කියවලා නැහැ මම කියවන බව දැනගෙන එතුමා පාර්ලිමේන්තුවෙන් හම්බෙන ඔක්කෝම දෙන්නේ මට මම කියනවා ඒවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපි මේ වගකීම දැනුම් තේරුම් ඇතිව ඉගෙන ගන්න උත්සාහ කරනවා. හැබැයි ඒ දැනුම අරගෙන ඔබතුමාගේ කකුළෙන් ඇදලා ඔබතුමා පාරිශුද්ධබාවයෙන් යන්න හදන ගමනට අකුල් හෙලන් නැහැ. හැබැයි ඒක නෝන්ජල්කමයි නිවටකමයි හැටියට ගන්න එපා. ඕනම වීදියක සටන් කරපු දේශපාලනය නිසාම මාස 14කට වැඩි කාලයක් හිර බත් කාපු අය තමා අපි. පක්ෂවල දේශපාලනයට ඒ නිසා අපිත් ඕනි යුධ පිටියක හැප්පෙන්න ගහගන්න වීදි සටන් කරන්න ඕනිම දේකට සූදානම්. හැබැයි අපි දැන් වයසත් එක්ක පරිණත වෙනවා කියන්නේ ඔන්න ඕකයි. ඒ නිසා ඔබතුමාලත් එක්ක සාකච්ඡා කරලා සම්මුතියකට ඇවිල්ලා කටයුතු කරමු. සභාපතිතුමා හඳුන ගන්නේ මුලින්ම පත්මා වැත්තැව මැතිනියගේ ගෙදරදී එදා ඉදලා අපිත් එක්ක සහ සම්බන්ධතාවයක් තිබුණා. මම මේ ටික හරි කීවේ මට තේරුම් යනවා මෙහෙම යනකොට මේ යෝජනාවල් එකක් දෙකක් නිසා, අපේ සභාවේ අඛණ්ඩ ඒකාබද්ධතාවය සුහදත්වය පළුදු වෙමින් යන බවක් මට දැනෙනවා. අපි එතෙන්නට යන්න හොඳ නැහැ ගරු සභාපතිතුමනි. ඒ නිසා ඔබතුමා මේවා පිළිබඳව අවධානය යොමු කරලා පොල පිළිබඳව සාකච්ඡාවක් අපිට ලබා දෙන්න අද පොලට ගිහිල්ලා පැහැදිලි කරන්න පාර්කින් එකට හානියක් වෙන් නැහැ මෙන්න මෙහෙම වෙන්නේ එතකොට ඒගොල්ලෝ කියන චෝදනා ටික ප්‍රතික්ෂේප වෙනවා. පොලේ මිනිස්සු වෙනුවෙන් තමන්ගේ සහෝදරයාටත් අසාධාරණයක් කරන්න ඔබතුමා ලෑස්තියි. මෙච්චර පිරිසිදුව විනිවිදව වැඩ කරලා නිකන් අහක යන දෙයක් නිසා මඩ ටිකක් දා ගන්නේ . කතා කරපුවාහ පුදුම පාරිශුද්ධබාවයනික් මේ වැඩේ වෙලානේ. ඒවගේම අපිට මේ ලියුම් එවනවා. අර මාළු ලැල්ල ලිපිය සභාවට දාන්න දාලා ඔබතුමා තීන්දුව ගන්න සාකච්ඡාවකට සම්මුතියකට ගිහින් තීන්දුවක් ගන්න ඔබතුමාගේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය ඇතුළේ සාමූහිකත්වය රැක ගන්න උත්සාහ කරන්න. ඒ වෙනුවෙන් විපක්ෂයේ සියලු දෙනා සහාය දෙන්න එක හඬින් ඉන්නවා. එක් කෙනෙක් විරුද්ධ නැහැ ඔබතුමාට. පුදුමාකාර වූ කැමැත්තක් තියනවා සහයෝගය දෙන්න. අත් දෙකම උත්සන්න කැමතියි. අතුකෝරාල මන්ත්‍රීතුමත් කීවේ මට මොනවාත් ඕනි නැහැ සහයෝගය දෙනවා කියලා වීථි පහනක්වත් ඕනි නැහැ කියනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, වීථි පහන් ගැන කතා කරන් නැහැ ඔබතුමාගෙන් කිසිම වරප්‍රසාදයක් මම ඉල්ලන්නෙත් නැහැ ඉල්ලන්න එන්න අදහසකුත් නැහැ. එකම දෙයක් උනා අකුණක් ගහපුවාහම මගේ ගෙදර ළඟ වීථි පහන් දෙකක් පිච්චුණා. ඒක පුළුවන් නම් කරලා දෙන්න කීවා. ඒත් මම කීවා සභාපතිතුමාට ප්‍රශ්නයක් නොවේ නම්, අර්බුදයක් නැත්නම් ඔබතුමාට මේක කිරීම සම්බන්ධව ගැටලුවක් නැත්නම් වීථි පහන් දෙක හදලා දෙන්න කියලා. හැබැයි ඒ කණුවට එහා පැත්තේ හදලා තිබ්බා බල්බ් ගෙනාපුවාහම මොකක් හරි කරමු කීවා. හැබැයි මගෙ දෙක හැදුන් නැහැ. ඒත් ගැටලුවක් නැහැ සභාපතිතුමනි. සියලු දෙනාටම ස්තූතියි.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු මන්ත්‍රීවරුනි. මේ සභාවේදී හරියටම කීවා කියලා මතක තියා ගන්නකෝ. මන්ත්‍රීවරු 24 දෙනාටම මේ මම කියන්නේ අපි එකඟතාවයකට එමු. මොනවා හරි හදිසි යෝජනාවක් තියේ නම්, මම 8.00 – 8.30 වෙනකොට එනවා උදේ 9.00 ට කලින් කාර්යාලයේ සීට් එකේ ඉද්දි දෙන්න. මෙතෙන්ට ඇවිත් වාඩි වුණාම ගෙනත් දෙන්න එපා. ඒක වැරදියි. නැතුව වෙන ප්‍රශ්නයක් නෙවේ. උදේම ඇවිත් මට දෙන්න.

එතකොට මම ඒක ගැන කියවලා අවබෝධයක් ඇතිව එන්න පුළුවන්. ඒ එකඟතාවය තියනවා නැවත ඒ සම්බන්ධයෙන් මට චෝදනා කරන්න බැහැ. ගරු මොහාන් මන්ත්‍රීතුමා, චමින්ද මන්ත්‍රීතුමා ගොඩාක් දේවල් කීවා මම උත්තර දීමෙන් වළකින්නම්කෝ.අපි ප්‍රියන්ත මන්ත්‍රීතුමාටත් අවස්ථාවක් දීලා අවසන් කරගමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමනි, වැලිගම ප්‍රාදේශිය සභාවේ සභාපතිතුමාගේ ඝාතනය සම්බන්ධයෙන් ජාතික ජන බලවේගයේ මන්ත්‍රී කාණ්ඩයම විදිහට අපිත් ශෝකය ප්‍රකාශ කරනවා. ඒ යෝජනාව ගෙන ඒම සම්බන්ධයෙන් අපේ කිසිම විරෝධතාවයක් නැහැ. නමුත් ඒ වගේම තමා මහජන නියෝජිතයෝ විදිහට තංගල්ල ප්‍රාදේශීය සභාවේත් අනතුරක් වෙලා එහි සේවකයෝ විසි ගණනක් අභාවයට පත් වුණා. ඒ අවස්ථාවේත් මම හිතනවා ඔය විදිහටම හිතලා මේ සභාවට යෝජනාවක් දැම්මා නම්, ගොඩාක් වටිනවා. දේශපාලඥයාත්, සභාවේ සේවකයෝ ටිකටත් මරණය කියන දේ පොදුයි. ඒ නිසා ඒ වගේ යෝජනාවක් මේ සභාවට එදත් ආවා නම් වටිනවා කියලා මම හිතනවා. ඒ සම්බන්ධයෙන් මම මතක් කර සිටිනවා. ඒ වගේම තමා පොලේ ප්‍රශ්නයේදී මොහාන් මන්ත්‍රීතුමා ලොකු අතීතයක් කීවා. ඒ අතීතය සම්බන්ධයෙන් අපිට ලොකු අදහසක් නැහැ. නමුත් මමත් පොල සම්බන්ධයෙන් ප්‍රශ්නයක් දකිනවා. හේතුව තමා සභාපතිතුමා දක්වපු අදහස් හා චමින්ද මන්ත්‍රීතුමා, මොහාන් මන්ත්‍රීතුමා ඒවගේම සමන්ත මන්ත්‍රීතුමා දක්වපු අදහස් ඔක්කෝගේම මට එක දෙයක් ගම්‍ය වුණා. යම්කිසි අක්‍රමිකතාවයක් වෙලා තියනවා කියලා. එහෙම නම් ඔබතුමා නැවත මෙම පොල නවීකරණය කරන්න හදනවා. මේ නවීකරණය කරන්න හදපුවාහම මෙහිදී සිදු වී ඇති අක්‍රමිකතාවයන් හොයලා බලලා නිවැරදි නොකළොත් මේකේ චෝදනාව සභාපතිතුමාට ඉහළින්ම එනවා. එවගේම ඔබතුමා ප්‍රමුඛ මන්ත්‍රී කණ්ඩායමට. මේකට බාධක විරෝධතා එන්න පුළුවන් නමුත් මේ පිළිබඳව අනිවාර්යෙන්ම හොයලා බලලා සියලු දෙනාටම සාධාරණයක් වෙන විදිහට කටයුතු කළ යුතුයි කියලා මම හිතනවා. අතීතයේ ඉඳලා ආපු විෂමතාවය දැන් හරි නිවැරදි විය යුතුයි. ඒ අවස්ථාව ඇවිත් තියනවා ඒ නිසා ඒක නිවැරදි කරන්න කියලා ඔබතුමාගෙන් මම ඉල්ලා සිටිනවා. ඒ වගේම තමා සමාජ මාධ්‍ය ජාලාවල විශාල වශයෙන් ආණ්ඩුවට පහර එල්ල කරනවා. ඒ පහර දීමේ එක පැත්තකින් මම හොඳක් දකිනවා. ඒ කියන්නේ සමාජ මාධ්‍ය තුළ ෆේස් බුක් හිමිකාරයෝ ඒවගේ පහර දෙන පුද්ගයෝ දිහා බැලුවාහම බහුතරයක් ආණ්ඩුවට විරෝධීන් සිටින්නේ. එතකොට මේ ආණ්ඩුව යම්කිසි හොඳ ගමනක් යනවා කියලා ඒ තුළ ගම්‍ය වෙනවා. ඒ වගේම අපිට ඇස් පනාපිටම දකින්න ලැබෙනවා ආණ්ඩුව මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධයෙන් ලොකු මෙහෙයුමක් දියත් කරනවා. අපරාධ මැඩ පැවැත්වීමට ලොකු මෙහෙයුමක් දියත් කරනවා. මේ දේවල් සමාජයට විය යුතු දේවල්. ඒ විය යුතු දේවල් කරනකොට ඒ හා සබැඳි පුද්ගලයන්ට යම් යම් රිදීම් සිද්ධ වෙනවා. ඒ පුද්ගලයන්ට නීතියේ සරණක් නැති වෙනකොට සමාජයේ පිළිගත් දේශපාලඥයෙකුගේ සරණක් නැති වෙනකොට ඒ පුද්ගලයාට තියන එකම සරණ තමා සමාජ මාධ්‍ය. එතකටෙ ඔවුන්ට අවශ්‍ය විදිහට සමාජ මාධ්‍ය හසුරවනවා. සමාජ මාධ්‍ය වාරණයට නීතිරීති නැහැ ඒ නිසා ඔවුන්ට අවශ්‍ය විදිහට සමාජ මාධ්‍ය හසුරවනවා. ඒ නිසා සමාජ මාධ්‍ය කියන්නේ එක සාධකයක් විතරයි. ඒ ගැන අපි කිසිසේත්ම වැඩි අවධානයක් යොමු කරන්න ඕනි නැහැ කියන මතයේ මම ඉන්නවා. ඒවගේම තමා ගරු සභාපතිතුමනි, මේ සභාවට ලිපි ඉදිරිපත් කිරීමේදී මාළු කඩයක් සම්බන්ධව මන්ත්‍රී මණ්ඩලයේ සියලුම දෙනාට ලැබුණා. මේ ගැන ඔබතුමාගේ පැහැදිලි කිරීම ඇති. මමත් යෝජනා කරනවා මෙවැනි ලිපි එනකොට මහ සභාවට ඉදිරිපත් කරලා ඔබතුමාගේ අදහස් ඉදිරිපත් කරන්න. ඒ අනුව අපි තීරණයක් ගමු යම්කිසි හේතුවක් මත දෙන්න බැහැ කියලා පැහැදිලි කිරීමක් කරනවා නම්, මන්ත්‍රී මණ්ඩලයේ තීරණයත් සමඟ අපි ඒක ප්‍රතික්ෂේප කරමු. චමින්ද වර්ණසූරිය මන්ත්‍රීතුමා කීවා අජිත් පරණගමගේ කියන පුද්ගලයාට ගෞරව කරනවා කියලා. ඒ ගෞරවය පක්ෂයක් විදිහට අපිත් බලාපොරොත්තු වෙනවා. ඒ ගෞරවය නිරන්තරයෙන් රැක ගනී කියලත් අපි බලාපොරොත්තු වෙනවා. එලෙස රැක ගන්න නම්, මේ පොඩි අඩුපාඩු ටික නිවැරදි කර ගන්න ඕනි. මොකද අපි කිසිසේත්ම සභාපතිවරයා විදිහට අපේ පක්ෂයෙන් පත් කරපු සභාපතිවරයා විදිහට අපි කිසිම අවස්ථාවක බලපෑමක් කරන් නැහැ. ඒ බලපෑම කරන්න තිබ්බේ, ගරු මන්ත්‍රීතුමන්ලා අය වැය හදන වෙලාවේ. එවෙලේ අපි බලපෑමක් කරා නම් කිසිසේත්ම මේ විදිහට අයවැය තුළ ප්‍රතිපාදන වෙන් කරන්න බැහැ. හැබැයි අපි හැම වෙලාවේම හිටියේ මන්ත්‍රී මණ්ඩලය හිටියේ මේක සභාවක් සියලු දෙනාම සභිකයෝ සියලු දෙනාම මහජන නියෝජිතයෝ විදිහට මෙතෙන්ට ඇවිල්ලා ඉන්නේ සියලු දනාටම සමානව අයවැය දෙන්න කියන මතයේ. ඒකෙදී අපි කිසිම මන්ත්‍රීවරයෙක් විරුද්ධ වුණේ නැහැ. හැබැයි හොයලා බලන්න නාරම්මල, පොල්ගහවෙල

ප්‍රාදේශීය සභාවල කිසිම කෙනෙකුට ප්‍රතිපාදන වෙන් කරලා නැහැ. මලගෙදරකට ආපු පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක් ඇහුවා කොහොමද අපේ අයවැය කියලා මන් කීවා කිසිම ගැටලුවක් නැහැ අපේ අයවැය සම්මත වුණා කියලා. සියලු දෙනාටම සම සේ අයවැය දීලා තියනවා කීවා ඒක විය යුත්තක් සේ සලකනවා කියලා කීවා. එතුමා කීවා අපේ නම් කිසිම කෙනෙකුට දෙන් නැහැ කියලා. මන් ඇහුවා ඇයි කියලා ආණ්ඩු පක්ෂයේ අයට දුන්නා විපක්ෂයේ අයට දුන් නැහැ කියලා කීවා. ඒ වගේ තත්වයක් තියෙද්දී තමා සභාපතිවරයා සියලුම දෙනා එකයි කියලා ඒ විදිහට කටයුතු කළේ. ඒ නිසා ඒ ගරුත්වය අපි තවදුරටත් සභාව තුළ බලාපොරොත්තු වෙනවා. ඒවගේම නාරද මන්ත්‍රීතුමා කතා කරන අවස්ථාවේ, දෙන්නා තුන්දෙනා කතා කරන වෙලාවේ රීති ප්‍රශ්නයක් ආවා. කනිෂ්ට මන්ත්‍රවරුන් විදිහට අපි මෙතන ඉද්දී ජොෂ්ට මන්ත්‍රීවරු නැගිටලා ඒ විදිහට හැසිරෙද්දී අපි කොහොමද ඔයගොල්ලන්ගෙන් ආදර්ශයක් ගන්නේ කියලා පොඩි කණගාටුවක් ඇති වුණා. මේ සභාව තුළ අපි එහෙම බලාපොරොත්තු වෙන් නැහැ. අපි ගරුකර යුත්තාට ගරු කරනවා ඔබ ජොෂ්ට මන්ත්‍රීවරු අවුරුදු ගණනක් මේ සභාව නියෝජනය කරලා තියනවා. ඒ අත්දැකීම්වලින් අපි පාඩම් ඉගෙන ගන්න කැමතියි. සභාවට සභිකයෙක් විදිහට ආවා කියලා අපි සියයට සීයක් දැනගෙන ආව පුද්ගලයෝ නෙවේ. දේශපාලනයට ආධුනිකයි. එහෙම ඇවිල්ලා අපි යම් යම් දේවල් අධ්‍යයනය කරනවා. යම් යම් දේවල් ඉගෙන ගන්නවා හැබැයි ජොෂ්ට මන්ත්‍රීවරුන්ගේ හැසිරීම හා ක්‍රියාකලාපය උඩ යම් යම් දේවල් ඉගෙන ගන්නවා වෙනුවට මේ වගේ දේවල් එකතු කර ගන්නවා. එතකොට මේවගේ පුද්ගලයින්ගෙන්ද අපි අත්දැකීම් ගන්නේ කියලා කලකිරීමක් ඇති වෙනවා. ඒ තත්වයට පත් වෙන්න අවශ්‍ය නැහැ කියන ඉල්ලීම මම කරනවා. ප්‍රශ්න ගැටලු තියනවා යම් යම් තැන්වල වාද විවාද ඇති වෙනවා හැල හැප්පීම් ඇති වෙනවා. ලංකාවේ දේශපාලන ඉතිහාසය දිහා බැලුවාහම පැටලුණ නූල් බෝලයක් වගේ, එක තැනකදී මිනිස්සු මරා ගන්නවා, තව තැනකදී ගහ ගන්නවා, තව තැනකදී ඒ මිනිස්සුම තේ මේසයේදී වාඩිවෙලා තේ බොනවා පාටි වලට යනවා. ගැටගැහිලා තියන දේශපාලන සංස්කෘතියක් ඒක ලිහා ගන්න නම් අපි එකමුතු වෙන්න ඕනි. සභාව ආරම්භයේදී පවා අපි ඒක කීවා. ඒ දේ ඉදිරියටත් අපි බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම ජොෂ්ට මන්ත්‍රීවරුන්ගෙන්. කනිෂ්ට මන්ත්‍රීවරු දොලොස් දෙනෙක් ඉන්නවා ඒ බවත් සිහිපත් කරනවා. ඒ වගේම තමා කාර්ය මණ්ඩල රැස්වීම ගැන ගැටලුවක් මතු කරා ඒක වැරදියට වටහා ගන්න එපා. මෙතන අපේ ඉන්න මන්ත්‍රීවරු දොලොස්දෙනා සභාවේ අංශ ප්‍රධානීන්, කාර්ය මණ්ඩලය කිසි කෙනෙක් අඳුනන් නැහැ. ප්‍රාදේශීය සභා රැස්වීම්වලට, මහසභාවට එනවා. මෙතනින් එළියට යනවා ඊට අමතරව තාක්ෂණික නිලධාරීන් දෙදෙනා හඳුනනවා. ඒවගේ කීප දෙනෙක් විතරයි හඳුනන්නේ. ඔබතුමාලා අවුරුදු ගණනක් සභාවේ හිටපු අය එතකොට ඔබතුමාලා හොඳට හඳුනනවා. ඒනිසා හඳුන්වා දීමක් පමණයි එතන කරේ. එහෙම නැතුව කාර්ය මණ්ඩල රැස්වීමට වාඩි වෙලා ඒ රැස්වීම අපි අතට ගන්න හැදීමක් නෙවේ එතනදී කරේ. අංශ ප්‍රධානීන් හඳුනා ගෙන ඒගොල්ලෝ ඉටු කරන කාරය භාර්යය මොකක්ද කියලා දැන ගැනීම විතරයි සභාවේ කටයුතු කරනකොට ඒ පිළිබඳව දැන ගැනීම අත්‍යාවශ්‍යයි. අපි ලිපියක් දෙන්න ආවා නම් ඒක අහවල් කෙනාට දෙන්න ඕනි කියන අදහස අපිට තියෙන්න ඕනි ලියුම භාර ගන්න කෙනාගෙන් ආයෙත් ඇවිත් ලිපියට මොකද වුණේ කියලා ආයෙත් එයාගෙන් ඇවිත් අහන්න බැහැ. අංශ ප්‍රධාන හරහා ඒ ලිපියට අදාලව විෂය නිලධාරියා හොයාගෙන මේ ලිපියට මොකද වුණේ කියලා දැන ගන්න වෙනවා. ඒ නිසා ඒ හඳුනා ගැනීම පමණයි එතන උනේ. එහෙම නැතුව කාර්ය මණ්ඩලය ආක්‍රමණය කරන්න හැදුවා නෙවේ සමන්ත මන්ත්‍රීතුමා කීවා වගේ ගමේ මරණධාර සමිතිය ගන්න යන් නැහැ. ඒක බොරුවක් සමාජ ප්‍රචාරයක් නැත්නම් ග්‍රාම සංවර්ධන සමිතිය ගත්තා කියයි මරණාධාර සමිතිය ගත්තා කියයි . මමත් අපේ ග්‍රාම සංවර්ධන සමිතියේ සභාපති. එතනදී අපි සාමාජිකයෙක් විදිහට වාඩි වුණාම සභාපති සඳහා යෝජනා කරනවා එතකොට මට ඒක ප්‍රතික්ෂේප කරන්න බැහැ. ජාතික ජන බලවේගයේ කියලා ප්‍රතික්ෂේප කරන්න බැහැ. අපි පොඩි කාලයේ ඉඳන් සමාජ සේවා කටයුතු කළා. ගමේ මරණාධාර සමිතියේ හිටියේ ක්‍රීඩා සමිතිවල හිටියා මේ වෙනකල්ම අපි හැමදේකදීම නියෝජනය කරා. ඒ පදනම මත තමා යෝජනා කරන්නේ. ඒ නිසා ඒ ගැන වැරදි වැටහීමක් ඇති කරගන්න එපා, සිදු වූ දේවල් පිළිබඳව නැවත ආවර්ජනය කරමින් හොඳ සභාවක් විදිහට ඉදිරියට කරගෙන යමු කියලා ඉල්ලා සිටිමින් ස්තූතිවන්ත වෙනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු මන්ත්‍රීවරුනි, සියලු දෙනාගෙන්ම මම ඉල්ලා සිටිනවා අද වැඩ කටයුත්තකට සම්බන්ධ වෙන්න තියනවා. ඒ නිසා කාලය පොඩ්ඩක් කළමනාකරණය කරගෙන අද අවසන් කරලා දෙන්න පුළුවන් නම් හොඳයි. වෙන දවසක ගොඩාක් කතා කරමු.

ගරු මන්ත්‍රීවරුනි, අද දිනට නියමිත න්‍යාශයපත්‍රානුකූලව සාකච්ඡා කල යුතු කරුණු අවසන්. ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් එක් රැස් වූ ගරු උප සභාපතිතුමිය ඇතුළු සියළුම ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලාටත්, ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ සියළු නිලධාරීන්ටත් ස්තූතිය පල කරන අතර අද දිනට නියමිත මහා සභාවේ කටයුතු නිමා කරනවා.

මෙදින ප.ව 11.45 ට පමණ සභාවේ කටයුතු නිමාවට පත් විය.

ඉහත සඳහන් වාර්තාව 2025.12.23 දින පැවති මහ සභාවේදී ස්ථිර කරන ලද බව සහතික කරමි.

2025.12.23
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී.

සභාපති,
අලව්ව ප්‍රාදේශීය සභාව,
අලව්ව.